‘පට්ඨාන’ විසිහතර වෙනි දේශනාව (නා නා ක්‍ෂණික කර්ම ප්‍රත්‍යය)

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස

දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හෙබි විසිතුරු දේහ සම්පත්තියක් ශරීර සම්පත්තියක් පිහිටියාවූ දරන්නා වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේට අසූවක් අනුව්‍යංජන ලක්ෂණයන්ගෙන් සමන්නාගත වූ 108 ක් මංගල ධර්මයන්ගෙන් සමන්නාගත වූ රූපකාය සම්පත්තියක් ඇති ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට ඒ රූප කාය සම්පත්තියටම සරිලන සීල සම්පත්තියක් දරන්නාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට සීලයෙන් පදනම් වූ අනන්ත අපරිමාණ ඥාන සම්පත්තීන්ට පාදක වූ සමාධි ගුණයක් දරන්නාවූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට අභිඥා ඥාන ධර්මයන්ගෙන් පිරුණා වූ ඒවාගේම විපස්සනා ඥාන ධර්මයන්ගෙන් පිරුණාවූ අතීතය අනාගතය වර්තමානය කියන්නාවූ කාලත්‍රයට සම්බන්ධ සියලුම ස්කන්ධ ආයතන ධාතු ඉන්ද්‍රිය පටිච්චසමුප්පාද චතුරාර්ය සත්‍ය ධර්මයන් දකින්නාවූ අවබෝධ කරගන්නා වූ දේශනා කරන්ට හැකි ශක්තියක් ඇත්තාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ ශාන්තිනායක සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ සන්තානයේ පහළ වී වදාළා වූ ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම මාර්ගයේ ගමන්කොට නිර්වාණ ධාතුවට පත්වී වදාළා වූ අශ්ඨාර්යපුග්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ආනුභාව බලයෙන් ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් සංඝ රත්නයේ ආනුභාව බලයෙන් වන්දනා කල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ පින්වත් සැම දෙනාටම අපි මේ දහම් වැඩ සටහන තුලින් කියල දෙන්නාවූ සියලුම ධර්ම කරුණු ඉතාමත්ම හොඳින් වටහා ගන්ට අවබෝධ කරගන්ට සැමදෙනාටම නුවණ පහළ වේවා! සිහිය වැඩේවා! ඒවාගේම සිහියෙන් නුවණින් යෝනිසෝමනසිකාරයෙන් එක එක වචනයක් පාසා ධර්ම කාරණයක් කාරණයක් පාසා හොඳින් වටහාගෙන හොඳින් අවබෝධ කරගෙන සැම දෙනාටම අමාමහ නිවනින් සැනසෙන්ට ලැබේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා.

අපි කථාකරන්නේ පට්ඨාන ධර්ම කරුණු ටිකක්. එතකොට ගිය සතියේ අපි කථා කළා කර්ම ප්‍රත්‍යය පිළිබඳව. ‘කම්ම පච්චය’ - දැන් සූවිසි ප්‍රත්‍යය ධර්මයන් කථාකරගෙන යනකොට එක තැනකදී අපිට හමුවෙනවා කර්ම ප්‍රත්‍යය. ඒ කියන්නේ කර්මය ප්‍රත්‍යය වෙන ආකාරය. ඒ කර්මය තවත් ධර්ම වලට ප්‍රත්‍යය වෙන කාරණය අපි හොඳට මේකෙදි තේරුම් ගන්නට ඕන. ආකාර දෙහෙකට තියෙනවා - ඒ තමයි කර්මය කියන ධර්මය තවත් ධර්ම වලට යම්කිසි රුකුලක් - යම්කිසි උපකාරක භාවයක් - යම්කිසි උදව්වක් - බලපෑමක් කරනකොට ඒ

බලපෑම - ඒ උපකාරක ස්වභාවය - උපකාර වීමේ ගතිය - ආකාර දෙහෙකට සිද්ධ වෙනවා. අපි මෙතැනදී කරුණු කීපයක් බොහොම පරෙස්සමින් තේරුම් ගන්ට ඕනෑ. ඒ තමයි ඒ ආකාර කීපය. එකක් තමයි 'සහජාත භාවයෙන්' කර්මය ප්‍රත්‍යය වෙනවා තවත් ධර්ම වලට.

ඒකෙ කථාව අපි ගිය සතියෙත් මතක් කළා. අද මේ පින්වතුන්ට කියල දෙන්නේ 'නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය' කියන එකයි. මේ කර්ම ප්‍රත්‍යය කියන එක ආකාර දෙකක් තියෙනවා. ඒකෙ අද කියන්නේ නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය කියන එකයි. මේක අහගෙන ඉන්න මේ පින්වතුන්ට ධර්මය කියවල තිබුනා හෝ වේවා ආදූනික වශයෙන් ඉන්න අය හෝ වේවා මධ්‍යම ප්‍රමාණයේ ධර්ම දැනුමක් තියෙන අය හෝ වේවා පරෙස්සම් ඇතුව සිහියෙන් නුවණින් මේ කරුණු ටික තේරුම් ගන්ට ඕනෑ.

කර්මය කියල සලකන්නේ කුමක්ද? අපි දැනගතයුතු කරුණු කීපයක් තියෙනවා. කර්මය හැටියට සලකන්නේ කුමක්ද? ඒ කර්මය කියන ධර්මය අපි තෝරා ගන්නේ මොන දහම් කොටසින්ද? ඊළඟට නා නා ක්ෂණික කියන්නේ මොකක්ද?

මේ කරුණු ටික අපි ඉසෙල්ලා තේරුම් ගනිමු ප්‍රත්‍යය කථාවට යන්න කලින්. එතකොට මේකෙන් යම්කිසි පැහැදීමක් පැහැදිලියාවක් අවබෝධයක් ඇතිවේවි. මේ කරුණු ටිකෙන් අපි ඉස්සෙල්ලාම තේරුම් ගනිමු නා නා ක්ෂණික කියන්නේ මොකක්ද කියල. නා නා ක්ෂණික කියල කියන්නේ නොයෙක් අවස්ථාවල කියන එකයි. අපි හිතමු මෙහෙම. වෙන වෙන අවස්ථාවල - 'නා නා' කියන්නේ නම් 'නොයෙක්' කියන එක තමයි. අපි කියන්නේ 'නා නා විධ' කියල - 'නොයෙක් ආකාර' කියල - දැන් මේක තෙරුම්ගන්ට නම් අපිට ගැලපෙන්නේ - 'නා නා ක්ෂණ' කියල කියන්නේ 'වෙන වෙන අවස්ථාවකදී' කියන එකයි. ඒක තේරෙන්නේ - එක වෙලාවක කර්මයක් සිද්ධ කරනවා - එක වෙලාවක ඒ කර්මයේ විපාක මතුවෙනවා. බලන්ට - එක වෙලාවක කර්මය සිද්ධ වෙනවා - එක වෙලාවක ඒකෙ විපාකය මතුවෙනවා. එතකොට කර්මය සිද්ධ වෙන වෙලාවයි විපාක මතුවෙන වෙලාවයි කියල කියන්නේ එකම වෙලාවක සිදු වෙන්නේ නෑ - අවස්ථා දෙකක්. කර්මය කරන වෙලාවට එතන විපාක හිටින්නේ නෑ. විපාකයක් විඳින වෙලාවට කර්මය හැදෙන්නේ නෑ. ඔන්න ඔය කාරණය අපි තේරුම් ගන්න ඕන. ඒක නිසා තමයි නා නා ක්ෂණික කියන්නේ - වෙන වෙන අවස්ථාවල. කර්මය හැදෙන වෙලාවේදී විපාක නෑ. විපාකය විඳින වෙලාවේ කර්ම නෑ. ඒක නිසා කර්මයක් සකස් වෙනකොට සකස් වෙච්ච එකේ බලපෑම - කර්මය සකස් වෙලා ඒකෙ තිබෙන්නාවූ විපාක උත්පාදනය පස්සේ වෙලාවකට පුදුම විදියට බලපානවා.

දැන් අපි කෑමක් ගත්තම අපේ සමාජයේ තිබෙනවා 'ඔය කෑම අපත්‍යය වෙයි' ඒ කියන්නේ කෑමක් කෑවහම අපත්‍යය වෙනවයි කියල කියන්නේ 'ඕක ප්‍රත්‍යය වෙන්නේ නෑ - ලෙඩ හැදෙයි' කියල කියනවනේ. එතකොට ඒ වෙලාවේම නෙමෙයි ඔය ලෙඩ හැදෙන්නේ. කෑම කන වෙලාවේම නෙමෙයි, පස්සේ වෙලාවක තමයි ඕක සිද්ධ වෙන්නේ. එතකොට ආහාරය ගන්න වෙලාව වෙනයි - ලෙඩේ හදන වෙලාව වෙනයි. කර්මයක් සිද්ධ කරන වෙලාව වෙනයි ඒකෙ විපාකය මතුකරන වෙලාව වෙනයි. ඒක නිසා තමයි කියන්නේ වෙන වෙන අවස්ථාවකදී එක අවස්ථාවක හැදිච්ච දෙයක් තවත් අවස්ථාවක සිද්ධ වෙන දේකට

බලපෑමක් කරන්නේ ගැම්මක් ඇතිකරන්නේ සහ එතන සිද්ධ වෙන එකකට උපකාරක භාවයක් දක්වන්නේ කොහොමද කියන එකයි මේ කථාවේ තියෙන්නේ.

දැන් ඕකට උපමාවකුත් ධර්මයේ දක්වලා තිබෙනවා. ඒකත් අපි පස්සේ හිතමු. දැන් ඔන්න මම මේ කිව්වේ නා නා ක්ෂණයක කියන ඒ පුංචි වචනය මේ වෙලාවට තේරුම් ගත යුත්තේ කොහොමද කියන එක පිළිබඳව.

දැන් අපි යමු කර්මය කියන ධර්මයට. කර්මය කියන ධර්මය හොයා ගන්න ඕනෑ වෙන්නේ ධර්ම මණ්ඩලයකින්- ධර්ම සමූහයකින්. ඒ ධර්ම සමූහය තමයි චිත්තය කියන ධර්මය - චෛතසික ධර්මය කියන ටික. දැන් සිත් තියනවා 89 ආකාරයකට මධ්‍යම ප්‍රමාණයෙන් දක්වල. චෛතසික ධර්ම 52 ක් තියෙනවා. රූප ධර්මත් තිබෙනවා ඊට වඩා හාත්පසින්ම වෙනස් වෙච්ච ගුණ ස්වභාවයකින් - ඊටත් වඩා වෙනස් වෙච්ච ස්වභාවයකින් තමයි නිර්වාණ ධාතුව පවතින්නේ. එතකොට මේ සිත් කියන ධර්ම වලින් චිත්ත චෛතසික රූප නිර්වාණ කියන ධර්ම මණ්ඩලය - ධර්ම සමූහය - එකින් එකට - එකින් එකට වෙනස්. සිත නෙමෙයි චෛතසික - චෛතසික නෙමෙයි රූප - රූප නෙමෙයි නිර්වාණය.

ඊළඟට චිත්ත චෛතසික රූප කියන ගොඩෙන් සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයකට පිහිටා තිබෙන ගුණ ස්වභාවයක් - ධර්ම ස්වභාවයක් - ධාතු ස්වභාවයක් තමයි නිර්වාණ ධාතුව. රූපයට වඩා වෙනස් චෛතසික - චෛතසික වලට වඩා වෙනස් සිත. මේ ධර්ම මණ්ඩලය තුල එක එක හැඩ තිබෙන - එක එක ලක්ෂණ - ආකාර - ගුණ විශේෂ - ක්‍රියා විශේෂ වලින් යුක්ත වෙච්ච මේ ධර්ම සමූහයේ එක තැනක තියෙනවා චෛතසික ධර්ම යටතේ කියවෙන්නාවූ පුදුම විදිහේ බල ශක්තියක් - ඒවගේම පුදුම කෙරුවාවක් තිබෙන - පුදුම ක්‍රියා ශීලි ස්වභාවයක් - හැකියා භාවයක් තිබෙන්නාවූ ධර්මයක් - ඒක හඳුන්වනවා චේතනාව කියල. චේතනාව හැම හිතකම පහළ වෙන්නාවූ චෛතසික ධර්ම ගණයටයි ගැනෙන්නේ. හැම සිතකම පහළ වෙනවා. සර්වචිත්ත සාධාරණ චෛතසිකයක්. ඒ සර්වචිත්ත සාධාරණ චෛතසිකයක් වන ඒ ‘චේතනාව’ තනියෙන් පහළ වෙන්නේ නෑ. ඒ සර්ව චිත්ත සාධාරණ චෛතසික මණ්ඩලයේ ඉන්නාවූ අනිත් 6 දෙනාත් එක්ක තවත් චෛතසික ධර්ම රාශියක එක්කාසුවක් එක්ක තමයි මේ චෛතසිකය එහෙම නැත්නම් මේ චේතනාව කියන චෛතසික වැඩ කරන්නේ. මේ චේතනා චෛතසික තමයි කර්මය හැටියට සලකන්නේ. මේ චේතනා චෛතසිකය රංචුවක් හැටියට වෙනත් ක්‍රියා ස්වරූප තිබෙන - වෙනත් ලක්ෂණ ස්වභාවයන් තිබෙන්නාවූ චෛතසික ධර්මත් එක්ක පහළ උනහම මෙයාට - එහෙම නැත්නම් මේ චේතනාවට අමුතු හැකියාවක් තිබෙනවා අනිත් ධර්ම ටික ඒ අරමුණට අනුව මෙහෙය වීමේ - ඒවාගේම යොමු කිරීමේ මහා අමුතු ගතියක් - අමුතු බලයක් - අමුතු හැකියාවක් ඕකේ තිබෙනවා. ඒක නිසා දැන් අපි ඕකට උපමාවක් කියනවා මෙහෙම - ඒ තමයි - දැන් මේ යම් කිසි ආයතනයක manager කෙනෙක් - ඒ කියන්නේ ඒකෙ පාලකයෙක් - කළමනා කාරිත්වය - ඒ කියන්නේ ක්‍රියා කරවන්නා. ඒ කළමනාකාරවරයාගේ අධීක්ෂණය මෙහෙයවීම යටතේ වෙනත් වෙනත් සේවකයෝ ගොඩක් ඉන්නවා. ඒ කියන්නේ තමන්ට අවශ්‍ය තමන්ට නියමිත සේවාව නියමිත ක්‍රියාව සිද්ධ කරනවා අර කළමනාකාර තුමාගේ අධීක්ෂණය යොමු කිරීම යටතේ. හැබැයි ඒ කළමනාකාර තුමාට බෑ අර මිනුස්සු කරන්නාවූ එක එක වැඩ කරන්ට. ඒ කළමණාකාරිත්වයේ ක්‍රියාව - වැඩ වෙනස් එකක්. එයා අනිත් අය

යොමු කරනවා - මෙහෙයවනවා. එතකොට කළමනාකාරිත්වය නැතුව අනිත් අයට ඒ තමන්ට අදාළ වැඩේ කරන්ට තමන්ට හැකියාව තිබුන. ඔන්න ඔය වගේ මහා පරිසරයක් තමයි මේ චිත්ත ධර්‍ම රංචුව ක්‍රියාත්මක වෙනකොට පිහිටන්නේ. එතකොට මේ කියන්නාවූ මේ චේතනාව ඔය විදියට යම්කිසි දැනීමේ ක්‍රියාවකට හෝ දැකීමේ - ඇසීමේ - සුවඳ විඳීමේ - රස විඳීමේ - ඒවගේම ස්පර්ශය දැනීමේ හෝ එහෙම නැත්නම් සිතීමේ හෝ වෙනත් වෙනත් ක්‍රියාවක් සිද්ධ කිරීමේ හෝ වේවා අවස්ථාවකදී මේ චේතනාව අනිත් අයත් රංචු ගස්සාගෙන - අනිත් අයත් මෙහෙයවාගෙන - අනිත් අයත් එක්කාසු කරගෙන මහා අමුතු විදියේ ක්‍රියා ධර්‍මයක් සිද්ධ කරනවා. මෙතැනදී අමුතු කර්ම සකස් වීමක් අනිත් චෛතසික ධර්‍ම පොකුරත් එක්ක - තමන් ඒ ඉන්න හිතත් එක්ක එකතුවෙලා යමක් සිද්ධ කරහම - ඒ කියන්නේ ක්‍රියා ගුණයක් සිද්ධ කළහම - ඒ කියන්නේ ක්‍රියාවක් කළහම - කරන අනිත් ක්‍රියාවල වගේ නෙමෙයි ඒ කරන ක්‍රියාවට අමුතු විදියේ බල හැකියාවක් තියෙනවා - බලයක් එකතුවෙලා මැරී යනවා. ඔන්න එක අවස්ථාවක්.

මේක සිද්ධ වෙනවා අවස්ථා කීපයක. වෙන වෙන අවස්ථාවලදී පහළ වෙන සිත් අස්සේ මේ චේතනාව ක්‍රියාත්මක වෙනකොට කර්ම මෙතන පහළ වෙලා මෙතන නැති වෙලා ගිහිල්ල තවත් තැනක කොහොමද මේකේ පහළ වීම සිද්ධ වෙන්නේ - බලපෑමක් සිද්ධවෙන්නේ කියන එක අපි මෙන්න මේ විදියටත් හිතල තේරුම් ගනිමු. ඒ තමයි අපි කියනවනේ නිතර පාවිච්චි කරන උදාහරණයක් තිබෙනවා උපමාවක් තිබෙනවා මේ බීජ වර්ග වල. කෙනෙක් හිතන්න පුළුවන් දැන් මේක නිතර නිතර කියන කොට 'මේ ගිය සතියෙත් කිව්වා ඔය උපමාව - ගිය මාසෙත් කිව්වා - ගිය අවස්ථාවේදීත් කිව්වා - අර ස්වාමීන්වහන්සේත් කිව්වා - මේ ස්වාමීන්වහන්සේත් කිව්වා - මම ඉංග්‍රීසි හාමුදුරුවෝ කෙනෙකුගේ බණ අහන කොට ඒකෙත් කියල තිබුන ගහ ගැන' කියල. ඒක ඇත්ත වශයෙන්ම - ඒ ගහේ උපමාව හෝ වෙනත් උපමාවල් පාවිච්චි කරන්නේ වැටහෙන්නේ නැති දෙයක් තේරුම් ගන්ට ළඟින්ම උපකාර වෙන හින්දයි. අපි මේ බීජ වර්ගයක් ගත්තම බලන්ට වී ඇටයක් පැළ කරහම වී ඇටය සම්පූර්ණයෙන්ම නැති වෙනවනේ මේ ගොයම් ගහ හැදෙනකොට. අපි වී ඇටයක් මඩට දැම්මම ඒ වී ඇටයත් ඒ වී පොත්තත් සම්පූර්ණ වෙනස්වෙලා පරිවර්තනය වෙලා ගොයම් ගහක් හැදෙනවනේ. ගොයම් ගහ හැදෙනකොට වී ඇටය නෑ. ඒකෙ තිබ්ච්ච විදියක්වත් නෑ. මොන විදියට තිබුනද කියලවත් හොයා ගන්ට බෑ. සම්පූර්ණයෙන්ම නැතිවෙලා වෙනස් වෙලා විනාස වෙලා යනවා. නමුත් ඒ වී ඇටයේ හේතුවෙන් හදල දීපු ගොයම් ගහ තියෙනවා. ටික කාලයක් යනකොට ඔය ගොයම් ගහේ උඩ අග්ගිස්සේ හැදෙනවා නැවත වී කරල්. දැන් බලන්ට ඒ ගොයම් කරල් වල තිබෙන වී ඇට අර මඩට යට උනාවූ වී ඇටයට සමානයි. අවස්ථා දෙකයි - අවස්ථා දෙකක් තමයි තියෙන්නේ හැබැයි ඒ පළවෙනි අවස්ථාවේ තිබ්ච්ච හැඩය - ඒ වී ඇටේ දිග ප්‍රමාණය - ඒ වී ඇටේ ස්වරූපය - ඒ වී ඇටේ ඇතුලේ තිබෙන හාල් වල විදිය - ඒ හැම එකක්ම අර ගොයම් කරලේ හැදිච්ච එකට බලපෑමක් තිබෙනවා - වෙන පාටකින් නෙමෙයි - දැන් දුඹුරුපාට රතු හාල් තිබෙන වී ඇටයක් පැලකරොත් එහෙම ඒ ගොයම් ගහ හොඳට හැදීගෙන ගිහිල්ල ඒ ගොයම් ගහේ ඒ කොළ පාට ටික තමයි කරලට කිට්ටුවම තියෙන්නේ. හැබැයි එහෙම කියල කවදාකවත් මේ හැදෙන ගොයම් කරල් වල පාට කොළ පාට වෙන්නේ නෑ. වෙන පාටක් වෙන්නෙත් නෑ. ඒ ගොයම් ගහේ කරල් වල පාට අර නැතිවී ගිය මැරී ගිය කුණුවෙලා ගියා වූ ඒ වී ඇටය හා සමානයි. ඒ පාටම තමයි තියෙන්නේ. අවස්ථා දෙකක්. දැන් බලන්ට ගොයම් බීජය - ඒ හදල

දීපු වී ඇටයයි ඊට පස්සේ ගොයම් කරලේ ඇටයි හැදෙන කොට අවස්ථා දෙකක් - මාස කීපයකුත් ගතවෙලා - දවස් ගානක් ගතවෙලා. අවස්ථා දෙකක්නේ. එතකොට යම් කිසි විදියක ඒ මුල ගොයම් ඇටේ යම්කිසි හැකියාවක් බලයක් තිබුනානම් ඒ බලය ඒ මූල බීජ වී ඇටේ තිබෙනවා කරල්වලට බලපෑමක් කරන්න පුළුවන් මහා අමුතුම විදියේ ගතියක් - හැකියාවක් - ගුණ විශේෂයක්. කිසිම කෙනෙකුට තර්කයකින්වත් වෙන ක්‍රමයෙකින්වත් ඕක නෑ කියල කියන්න බෑ. සිහියක් කල්පනාවක් බුද්ධියක් තිබෙන්නාවූ කෙනෙකුට නම් කියන්න බෑ හැබැයි මනෝ විකාරයක් තියෙන්නාවූ කෙනෙකුට කියන්න පුළුවන්.

දැන් ඔය විදියට අවස්ථා දෙහෙකට ඔය සිද්ධිය වෙනවනේ. මේ චේතනාව හරියට ගියහමත් ඔය වැඩේ ඔන්න ඔයිට සමානයි. දැන් චේතනාව යම්කිසි අවස්ථාවකදී පහළ වෙනවා - ඒ පහළ වෙන කොට ඒ චේතනාව ඇති උනා - නැති වෙලා ගියා හිතෙන්. හැබැයි ඒ චේතනාව නැතිවෙලා යන්නේ අනාගතයේදී අර ගොයම් ගහේ කරල් හැදුනට පස්සේ අමුතු විදියේ ගතියක් එනවනේ ඒකට -ආන්න ඒවගේ හැකියාවක් බලයක් අනාගතේට රඳවලයි යන්නේ. ඒක කොයි හරියේ තිබෙනවද කොතන තිබෙනවද .... අපේ ශරීරය ගත්තයින් පස්සේ ඒ ශරීරයේ කෙස් වලටද ලොම් වලටද දත් වලටද ඇස් වලටද ඇස් පිල්ලන් වලටද කනේද කටේද brain එකේද එහෙම නැත්නම් heart එකේද ඔය කොහේවත් කියන්න බෑ. කොතන තියනවද දන්නේ නෑ. හැබැයි අර යන නාමධර්ම රාශියේ එක connection එකක කොහොමහරි තියෙනවා. දැන් බලන්ට ගොයම් ගහක් ගත්තයින් පස්සේ ඒ ගොයම් ගහේ මොකක් හරි තියෙනවද කියල වී ඇටේ සම්බන්ධයෙන්. ඒක මහා අමුතුම විදියේ ක්‍රියාවලියක්. ගොයම් ගහේ කඳේ කිසිම විදියට එහෙම එකක් නෑ. නමුත් ඒකට අවස්ථාවක් ආවට පස්සේ උඩ කරල් හැදිලා වෙන විදයකට හැදෙනවා. චේතනාව කියන ස්වභාවය - කර්මය ඔය විදියට හිතක පහළ වෙනවා. ඔන්න ඔය කථාව තමයි අද අපි සියලු දෙනාම තේරුම් ගතයුතු වන්නේ.

මේ නොයෙක් නොයෙක් අවස්ථාවල - එහෙම නැත්නම් වෙන වෙන අවස්ථාවල සිද්ධ වෙන්නාවූ කර්මය පිළිබඳ හිතනකොට අපිට අවස්ථා 33 කට යන්න සිද්ධ වෙනවා. ඒ කියන්නේ සිත් තියෙනවනේ 89ක් - විස්තරාත්මකව 121 යි හැබැයි මේ අපි කියන්නේ 89 ක්‍රමයට. ඒක ලේසියි. ඊළඟට දැන් ඔය සිත් 89ක් තිබුණාය කියල ඔය ඔක්කොම සිත්වල - ඔය සිත් 89 යේම බලය ගොඩ නැගෙන ගතියක් නෑ. එහෙම නෑ. අනිත් ඔය අවස්ථා කීපයක තමයි ඕක තියෙන්නේ. අපි බලමු ඒක කොහොමද කියල. දැන් ඔය සිත් 89 සහ චෛතසික ධර්ම ටික ගත්තයින් පස්සේ විශේෂයෙන් සිත්වල තියෙනවා - පින්වතුන් හොඳට හිතේ තියාගන්න - අහල තියෙන අයට ලේසියි - අලුත් අය මතක තියා ගන්න.

මේ සිත් 89 කොටස් කර ගන්නව. ඒ තමයි කුසල සිත් - අකුසල සිත් - විපාක සිත් - ක්‍රියා සිත් කියල ගොඩවල් 4 කට අපි ඕක බෙදා ගන්නවා. එහෙම බෙදා ගන්නේ ඇත්ත වශයෙන්ම සමහර සිත්වල තිබෙන්නේ කුසලමය ශක්තියේ ගුණයයි. ඒ කියන්නේ කුසලමය ගුණය තිබෙනවා. කුසල ශක්තියක් ඒකෙ තියෙනවා. ඒ කුසල ශක්තිය තියන එකට එහෙම කියන්නේ නැතුව වෙන මොකක් කියන්නද? ඒ කියන්නේ කුසලයක් - හොඳ දෙයක් - ඒ හොඳ ශක්තියක් එකතු උනහම - හොඳ බලයක් ගොඩ නැගුනහම සමහර සිත්වලින් ඒක

ඇතිකරන විපාකයත් හරි ලස්සන ප්‍රසන්න සුන්දර මුදු සෞම්‍ය සැහැල්ලු ආකාරයක්. ඒක නිසා එවැනි ඒවා සලකාගන්නවා කුසල් කියල.

නරක කටු වගේ කර්කශ ගොරෝසු කළු පාට ඒවාගේම විදින කොට දුක ඇතිවෙන ඒ බල එකතු කරන ඒවා - ඔය තාර පාටට තියෙන කළු පාටට තියෙන ඒවාට කියනවා අකුසලේ කියල. අකුසල ශක්ති තියෙන සිත් තියෙනවා කුසල ශක්ති තියෙන සිත් තියෙනවා සමහර ඒවා තියෙනවා විපාක. ඒ කියන්නේ ඒවා නිකංම නිකං පාවෙලා යනව වගේ සිත්. අනිත් ඒවා ක්‍රියා. මෙන්න මේ කුසල - අකුසල - විපාක - ක්‍රියා - කියන සිත් වර්ග 4 රෙන් මේ කියන්නාවූ කථාවට අපිට ගැලපෙන්නේ විපාක කියන ගොඩ අයින් කරාම කුසල සිත් සහ අකුසල සිත් දෙකයි අනිත් එක ක්‍රියා. ඔය තැන් වලදී විතරයි අපිට මේ කර්ම ප්‍රත්‍යය කථා කරන්න පුළුවන් කම තියෙන්නේ. නමුත් ඒකෙනුත් කර්මය ගොඩ ගැහෙන කර්ම රැස් වෙන එහෙම නැත්නම් කර්ම එකතුවෙන අවස්ථාවල් 33 තිබෙනවා. ඒ 33 න් අපි පොඩි වෙනසක් කරන්න ඕන. අපි ඒක එතනට ගිහිල්ල කරමු. මෙන්න මෙහෙමයි වෙන්නේ. හොඳට අපේ පින්වතුන් අහන්න - චේතනාව කර්ම හදනවා. දැන් ඔය සූත්‍ර දේශනාවලත් තියෙනවා **'සංඛාරා'** කියන්නේ මොකක්ද? **'අභිසංඛරෝති ති සංඛාරා'** කියල ඔය සංයුක්ත නිකායේ සූත්‍ර වල තියෙනවා - ලස්සන වචනයක්. **'අභිසංඛරෝති ති සංඛාරා'**- ඒ කියන්නේ කුසල අකුසල බල හදන නිසා - අමුතු ශක්තියක් අනාගතේට සම්බන්ධ කරලා ගොඩ නගන නිසා ඒකට කියනවා අභි සංස්කරණය කරනවයි කියල. එහෙම අවස්ථා ඇත්තටම තියෙන්නේ 29 යි නමුත් 33 හැටියට සලකා ගන්නවා එක විදියකට. අපි බලමු.

බලන්ට අකුසල් සිත් තිබෙනවා 12 ක්. ඔය අකුසල් සිත් 12 හේම චේතනාව වැඩ කරනවනේ. ඔන්න කර්ම හදන ස්ථාන 12. ඊළඟට කුසල් සිත් තියෙනවනේ 8 ක් - **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික'** ආදී වශයෙන් 8ක් තියෙනවනේ. එතකොට දැන් කියක් වෙනවද?

**අකුසල් 12 සිත් + කුසල් සිත් 8 = 20**

රූපාවචර කුසල ධ්‍යාන සිත්වලත් ඔය බ්‍රහ්ම ලෝකයේ එහෙම උපදින්ට බල ශක්ති කුසල් වැඩෙන ශක්තියක් හැකියාවක් තියෙනවා. ඒකනිසා එතන තිබෙනවා අවස්ථා 5 ක්. එතකොට දැන්

**අකුසල් 12 සිත් + කුසල් සිත් 8 + රූපා වචර ධ්‍යාන සිත් 5 = 25**

ඊළඟට තියෙනවා අරූපාවචර බ්‍රහ්මලෝකයට සම්බන්ධ අරූපාවචර ධ්‍යාන වඩාගෙන යනකොට අරූපාවචර කුසල් සිත් වලත් ඔය බලය ශක්තිය වැඩෙනවා. දැන් එතකොට

**අකුසල් 12 සිත් + කුසල් සිත් 8 + රූපා වචර ධ්‍යාන සිත් 5 + අරූපාවචර සිත් 4 = 29**

මේවා සංසාරයට සම්බන්ධයි. තව තිබෙනවා ලෝකෝත්තර මාර්ග සිත් 4. මේ ලෝකෝත්තර මාර්ග සිත් කර්ම හදන සිත් නෙමෙයි. නමුත් මෙතනදී අපි සලකා ගන්ට ඕන

මාර්ග සිතට පස්සේ තමයි ඵල කියන විපාක සිත් හැදෙන්නේ. ඒක ලෝකෝත්තරයි. කවදාක්වත්ම ඵල සිතක් ඇතිවෙන්නේ නෑ මාර්ග සිතක් පහළ උනේ නැත්නම්. සෝවාන් පුද්ගලයකුගේ හිතේ නිර්වාණය විඳින - නිර්වාණය ධරන - නිර්වාණය අරමුණු කරන කිසිම ඵල සිතක් පහළ වෙන්නේ නෑ ඒ කෙනෙකුගේ හිතේ මාර්ග සිත වැඩුනේ නැත්නම් - මාර්ග සිත පහළ උනේ නැත්නම්. මාර්ග සිතකට අනිවාර්යෙන්ම අනතුරුවම තමයි මේ කියන්නාවූ ඵල සිත් පහළ වෙන්නේ. ඒක නිසා විපාක වශයෙන් සළකන ලෝකෝත්තර ඵල සිත් වලට හේතුවක් හැටියට මාර්ග මූලයක් හැටියට උපකාර වෙන ධර්මයක් නිසා මාර්ග සිත් 4 - ඒකත් ඔතනදී සලකනවා බලපෑමක් කිරීමට තිබෙන කර්ම ශක්තිය කියල. ඒ කියන්නේ චිත්ත ශක්තිය කියල. එතකොට 33 ක් තියෙනවනේ. වරදවා වටහා ගන්ට හොඳ නෑ මාර්ග සිත්වල කර්ම රැස් කරනවාය කියල. මාර්ග සිත් 4 රේ කර්ම රැස් කරන්නේ නෑ. මාර්ග සිත්වලින් කරන්නේ තියෙන කර්මත් නැති කිරීම. හැබැයි ඒක ඵල සිත් වලට උපකාරයක් වෙන නිසයි ඒ හතර සලකන්නේ ඒ විදියට.

දැන් මෙතන 33 ක් තියෙනවා.

අකුසල් 12 සිත් + කුසල් සිත් 8 + රූපා වචර ධ්‍යාන සිත් 5 + අරූපාවචර සිත් 4 + මාර්ග සිත් 4 = 33

මෙතන තියනවා සිත් 33ක්. අකුසල වශයෙන් සිත් 12 ක් තියෙනවා. කුසල වශයෙන් 8 යි - රූපාවචර වශයෙන් 5යි - අරූපාවචර වශයෙන් 4 යි -ලෝකෝත්තර වශයෙන් 4 යි - සියලුම සිත් ගණන 33 යි. මේ 33 ට අනුකූලව වැඩ කරන තියෙනවා චෛතසික ධර්‍ම. එතනත් තිබෙනවා විශේෂයෙන්ම ඒ සිත්වලට අදාලව වැඩ කරන ටික. දැන් අපි බලමු - කුසල සිත් වලත් චෛතසික ධර්‍ම වැඩකරනවා ඒ අවශ්‍ය ප්‍රමාණයට - අකුසල සිත් වලත් අකුසල පක්ෂයේ වැඩ කරනවා - දැන් මේකේ ක්‍රියාවල් මෙතන පටලවා ගන්නේ නෑ හැබැයි මේ ටික අමුතු දෙයක්. මේවගේ හැදෙන ශක්තිය අර බීජ වර්ග වගේ. බීජ ශක්තිය වගේ. කුසල සිත් සහ අකුසල සිත් වල හැදෙන ශක්තියක් හැදෙන අමුතු ගතියක් අමුතු බලයක් හැදිලා ඒක එහෙම්මම ඒ වෙලාවෙම නැතිවෙලා යනවා. ඒ සිත්වල පහළ වෙච්ච චෛතසිකත් ඉතුරු වෙන්නේ නෑ හිත ඉතුරු වෙන්නෙත් නෑ. ඒකත් ක්ෂණික ආයුෂයක් තිබෙන ධර්‍මයක්නේ. ඉතින් මේක පේළියට පේළියට හේත්තුවෙලා හේත්තුවෙලා දිගට දම්වැලක පුරුක් වගේ දිගට පේළියට ගියාට ඉන්නේ එක මොහොතයි. මැරිලා යනවා. මෙහෙම උනාට මේකේ තිබෙන අනිත් ගතිය තමයි මේක නැතිවෙලා යනවා හැබැයි තව තැනක මේකේ නෑ කමක් තියාගෙන - මේ නැතිවෙලා යන්නාවූ කෙනාගේ නෑ කමක් කියාගෙන ඊට පස්සේ පරම්පරා සම්බන්ධයක් හදාගෙන ඒවාගේම ආකාර ස්වරූපයක් ඇතිකරගෙන මෙන්න තව එකක් කොහෙන් හරි වෙන වෙලාවක පහළ වෙනවා. දැන් ඔය සමහර පවුල් වල ඉන්නවා - අපි හිතමු මෙහෙ ඉන්නවා කියල ජයවර්ධන කියල එක්කෙනෙක්. එයාගේ පරම්පරාවේ සීයා හිටියා අන්තරා උනා ඊට පස්සේ දැන් මුණුපුරා ඉන්නවා එයාගේ තාත්තයි ඉන්නවා. දැන් මේ සීයා සමහර වෙලාවට ඔය මුණුබුරෝ දකින්නේ නැති අවස්ථාත් තියෙනවා දකින අවස්ථාත් තියෙනවා. සමහර වෙලාවට අපි අහල තිබෙනවා මුණුබුරෝ 'හරියට සීය වගේ' කියල.

සමහර වෙලාවට මුණුබුරා උපදින්ටත් බොහොම කලින් තමයි සීයා අන්තරා වෙලා තියෙන්නේ. ආච්චි අන්තරා වෙලා තියෙන්නේ. නමුත් මේ පරණ පුරුක් වල - පරණ ඒ සන්ධිස්ථාන වල - ඒ පරම්පරාවේ අර පෙර තිබ්ච්ච ඒ අයගේ ගුණ වශයෙනුත් ඒවගේම ශාරීරක සමහර ගති ලක්ෂණ හැඩ වශයෙනුත් පිහිටා තිබෙනවා - අවස්ථා දෙකයි, එතකොට මතු කරලා දෙනවා. එතකොට පසු කාලීනව කියනවා 'මේ මුණුබුරා හරියට අර මැරුණු සීයා වගේ' 'මේ මිණිබිරී හරියට අර මැරුණු ආච්චි වගේ'... ඔය වගේ කියනවනේ. එතකොට පරම්පරා සම්බන්ධතාවයන් නම්නුත් එහෙමයි - ගමෙනුත් එහෙමයි - වැඩකිරීමෙනුත් එහෙමයි - ක්‍රියාවෙනුත් එහෙමයි - ඔහොම තියෙනවා. අපි අහල තියෙනවා දැකල තියෙනවා. දැන් ඔය අවස්ථා දෙකක්. ඒ කියන්නේ බලය ගොඩනගන අවස්ථාව සහ ඒ බලයට නෑකම් කියන්නාවූ ඒකෙන් ගොඩ නැගිච්ච බලය release වෙලා නැතිවෙලා යන වෙලාව - ඒ කියන්නේ විපාකනේ - ඔන්න වෙන වෙන අවස්ථා දෙක.

අර අපි කිව්වනේ ඔය අවස්ථා 33 ක ශක්තියක් ගොඩ නැගෙනවයි කියල. ඒ අවස්ථා 33 ගොඩනැගෙන සිත්වල තිබෙනවා චේතනාව කියල වැඩ කරන අර චෛතසිකය - චේතනාව. ඔන්න ඔය අවස්ථා 33 වැඩ කරන චේතනාව තමයි මේ කර්ම ප්‍රත්‍යය හැටියට ඇදල ගන්නේ. මෙන්න මෙයා තමයි කර්ම ප්‍රත්‍යය කරන එක්කෙනා. එතකොට අවස්ථා 33 ක මෙයා වැඩ කරනවා. ලෝභ කරන අවස්ථා අටේම මේ චේතනාව ගිහිල්ල අර ලෝභයත් එක්ක එක්කාසු වෙලා රටේ නැති දේවල් වලට ලෝභ කරලා ලෝභ කරලා දැන් මේ කර්ම ගොඩනගා ගන්නවා. 'ලෝභ සහගත' ඒවා. දැන් එතන බලයක් හැදෙනවා - එතැනදී කරේ මොකක්ද? ලෝභ කිරීම වශයෙන්. සමහර වෙලාවට තරහ ක්‍රෝධ වෛර කරන තැන් වලට වලට යන අවස්ථා තියෙනවා. චේතනාව එතැනටත් ගිහිල්ල පැනල ඊට පස්සෙ මහා කටුක කර්කශ ගොරෝසු රළු ශක්තියක් හදා ගන්නවා. ඊළඟට යනවා මුලා වෙච්ච මෝහය තියෙන අරමුණු වලට ක්‍රියා වලට - ඊළඟට හොඳ ප්‍රසන්න ක්‍රියාවල් සිද්ධ කිරීම වශයෙන් අවස්ථා 8 ක් මේ බලය ගොඩනගා ගන්නවා. තව ඉතාමත් ශාන්ත උපශාන්ත අරමුණු ඔස්සේ ධ්‍යාන වශයෙන් චේතනා ශක්තිය ගොඩනගා ගන්නවා. ඒවගේම රළු ගොරෝසු දළ අරමුණු වලින් අයින්වෙලා නාම ධර්ම ඔස්සේ ගිහිල්ල අවස්ථා 4 කදී බලය ශක්තිය ගොඩ නගා ගන්නවා. ඔය විදියට බලය ගොඩ නගා ගන්න අවස්ථා 33 දීම තියෙනවා.

දැන් මේකට කියනවා නානා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය භාවය කියල. ඒ කියන්නේ කර්ම ප්‍රත්‍යය ශක්තිය ඔය හදා ගන්නේ. ඒ කියන්නේ ඔය චේතනාව අවස්ථා කීපයේදීම එනම් අවස්ථා 33 ම තියෙනවා - කර්ම ප්‍රත්‍යය ශක්තියක් තියෙනවා. ඒ කියන්නේ අනිත් එහෙකට දුර උනාට - අවස්ථා දෙකක් උනාට ඒ පළවෙනි අවස්ථාවේදී අනිත් තැනකට බලපෑමක් කරන්ට පුළුවන් ගතියක් තියෙනවා. දුරට දාල ඒකෙ බලයක් යොදන්ට පුළුවන්. අවස්ථා දෙකයි.

දැන් අපි පොඩි කාලේ කරපු වැඩක් තියෙනවා. ඔය ආච්චිලගේ සීයලාගේ කණ්නාඩි පොඩ්ඩක් හොරෙන් ගන්නවා. ඒ කියන්නේ හොරකමකටම නෙමෙයි නිකං නොදැනෙන්න ගන්නවා. අරගෙන අපි  යනවා අව්වට - පරණ කණ්නාඩි තියෙනවනේ. ඒවගේ තියෙනවා අර කාචය හැඩ කරලානේ හදල තියෙන්නේ. එතකොට ඒක අරගෙන ගිහිල්ල පුළුන් කැල්ලක් ගිනි කූරක් අරගෙන යනවා. අපි කරන්නේ කණ්නාඩිය focus කරලා අල්ලනවා ටිකක් දුරට තියලා. ගිනිකූර ටිකක් දුරට තියල අල්ලගෙන ඉන්නවා. දැන් බලන්ට ගිනි කූර තියෙන තැනයි කණ්නාඩි කාචය තියෙන තැනයි බැලුවයින් පස්සේ දුරයි - ස්ථාන වශයෙන් දුරයි. හැබැයි ටික වෙලාවක් ඔහොම අල්ලගෙන ඉන්නකොට අර ගිනි කූර පත්තු වෙනවා. එතකොට ගිනිකූරට කිසිම සම්බන්ධයක් නෑ ළඟ ගෑවිලාවත් නෑ අර කාචය. පුළුන් කැල්ලත් ඒ වගේ - පුළුන් කැල්ලත් ඒ වගේ - පුළුන් කැල්ලත් ඒ වගේ දුන් දාල පිච්චිලා යනවා. පුළුන් කැල්ලත් අපි කණ්නාඩි කාචයේ හප්පන්නේ වද්දන්නේ නෑ. ගිනි කූරත් හප්පන්නේ වද්දන්නේ නෑ. දැන් මේ අවස්ථා දෙහෙක - දුර තැන් දෙහෙක තියෙන්නේ. එක තැනක ශක්තිය එකතු කරනවා. එකතු කරලා තවත් තැනකට දෙනවා. කණ්නාඩියේ කාචයෙන් ඉර අව්වේ තිබෙන්නාවූ විහිදිලා තියෙන රස්නේ ගතිය ඔක්කොම එකතු කරනවා. එකතු කරලා එක තැනකට යොමු කරලා හරියට ගිනිකූර point කරලා පුච්චලා දානවා. පුළුන් කැල්ල point  කරලා පුච්චලා දානවා. කොළ කැල්ල පුච්චලා දානවා. මේ චෛතසික ධර්මවලත් ඔය විදියට තියෙනවා. ගොඩක් චෛතසික ධර්ම එකතුවෙලා වැඩ කරත් චේතනාව කියන එක පැනගෙන ගිහිල්ල අනිත් අයත් ඔක්කෝම එකතු කරගෙන ක්‍රියාවට යොදල මෙතන සිද්ධ වෙච්ච ඒ එකතුව තවත් තැනකදී තවත් තැනකට යොමු කරලා එතැනදී බලය issue කරලා දානවා. ඒ කියන්නේ නිකුත් කරනවා. දැන් අපි විපාක විඳිනවා කියල කියන්නේ මොකක්ද? විපාක විඳිනව කියල කියන්නේ බලය නිකුත් වෙනවා. අපි ඔය කියන්නේ අපල විඳිනවාය කර්ම විඳිනවාය කියල. මේ ඇවිල්ල තම තමන් විසින් ඉස්සරවෙලා ගොඩගහ ගත්ත බල ශක්ති - ඔය චේතනාව තමයි ඕක කරන්නේ. ඔය චේතනාව එක එක චෛතසික ධර්මත් හවුල් කරගෙන හැදිච්ච ගොඩ ගහගෙන තිබෙන්නාවූ  ඔය ශක්ති වල බලය තමයි දැන් අපේ තුලින් නිකුත් වෙන්නේ - ඒ කියන්නේ වේදනාව වශයෙන් - ප්‍රසන්න විඳවීම් වශයෙන් - ඇහීම් වශයෙන් - මිනුස්සු පිළිගැනීම් වශයෙන් - තෑගී බෝග ලබා ගැනීම් වශයෙන් - අනිත් පැත්තට කිව්වොත් ලෙඩ දුක් වශයෙන්. ඔන්න ඒවගේ තිබෙන  අර කර්කෂ ගොරෝසු බල මෙහෙ නිකුත් වෙලා නිකුත් වෙලා යනවා. අවස්ථා දෙකයි. එතකොට අර කුසල සිත් හා අකුසල සිත් වල ඒ චේතනා ටික ඇවිල්ලා තිස්තුනේම කරන්නේ මොකක්ද? හදනවා ශක්ති. ඔන්න බල වෙච්ච තැන. දැන් අපි ඕක ඔතනින් ඔහොම ඔය ටික හෙමිහිට හිතා ගනිමු. අවස්ථා 33 කදී  රංචු හැදෙනවා විශේෂයෙන්ම බලයක් ගොඩ නැගෙනවා.

ඊළඟට ඒක අස්සේ දැන් හිතාගමු අතීත වශයෙන් අපිට බලයක් ගොඩ නැගිච්ච අවස්ථා රාශියක් තියෙනවයි කියල. දැන් මෙහෙ විපාක සම්බන්ධයෙන් එන තැනක් තියෙනවා. දැන් මේකේ බලය කොයි හරියේද නිකුත් වෙන්නේ කොයි හරියේද නැවත ආයේ උඩට එන්නේ .. ඒ තමයි - විපාක සිත් කියල තිබෙනවා 36ක්. ඒ විපාක සිත් ටික එනකොට ඒවාට

ගැලපෙන චෛතසික ඒ කියන්නේ විපාක සිත් වල විතරක්ම වැඩ කරනාවූ චෛතසික ධර්ම ටිකත් එක්ක ඔන්න ඔය හරියේ තමයි මේ කියන්නාවූ අර බලය (ඉසෙල්ලා හදපු ඒවගේ බලය) නිකුත් වෙලා නිකුත් වෙලා යන්නේ. දැන් එතකොට බලය නිකුත් වෙන වෙලාවේදී අර කර්ම නෑ. හැබැයි ඒ බලය නිකුත් වීමට ඉස්සෙල්ලා හදපු බල ශක්තිය උපකාරවෙනවා. ඒකෙ බලයෙන් තමයි මේක එන්නේ. ඒක නිසා මේ විපාක සිත් ටිකට කියනවා කර්ම බලයෙන් හැදිච්ච නිසා - කර්ම ප්‍රත්‍යයයෙන් ගොඩනැගිච්ච නිසා කර්ම ප්‍රත්‍යයයෙන් ආපු නිසා මේවට කියනවා ප්‍රත්‍යය උප්පන්න ධර්ම කියල. මේවා අර බලයෙන් හටගන්නා ධර්ම - අර බලයෙන් නිකුත් වෙන - මතුවෙන ප්‍රතිඵල. මේ විපාක සිත්වලට ලඟ නැති උනත් අර කර්ම වල තිබෙන නෑකම පරම්පරා සම්බන්ධයක් ඕකේ තිබෙනවා. දැන් මෙන්න මෙහෙම එකක් තිබෙනවා.

මේ දවස්වල මිනුස්සු ටෙලිෆෝනේ වලට message තියනවා. ඉස්සෙල්ලා කථා කරනවා කථා කරලා බලනවා. ඒ වෙලාවේ ගන්නේ නෑ කවුරුත්. ඒකනිසා message එකක් තියනවා. ඒ message එකේ තමන්ට අයිති පණිවිඩේ record කරනවා. ඒ පණිවිඩේ record කරන වෙලාවේ ඔක්කොම ඒ සද්ද කෑලිටික අරකෙ record වෙනවා. ඊට පස්සේ ඉතිං record උනාට පස්සේ ෆෝන් එක අයිති කාරයා ඇවිල්ලා ඉතිං කවුද කථා කරලා තියෙන්නේ කියල බලනවා. බලන කොට අර තමන් නැති වෙලාවේ කථා කරපු දේ මෙතන තියෙනවා. කථා කරපු මනුස්සයා නෑ. දැන් අහන කෙනා ඉන්නවා. දැන් බලන්න අවස්ථා දෙහෙකදී - එක තැනකදී බලය ගොඩ නැගුවා - අනිත් තැනදී අහන්න තියෙනවා යමක්. කිසිම සම්බන්ධතාවයක් නෑ. නමුත් නෑ කියන්න බෑනේ. ඉස්සෙල්ල කථා කරපුවනේ තියෙන්නේ. යම්කිසි ශක්ති විශේෂයක නෑ කමක් පරණ එහෙකට සම්බන්ධතාවයක් තියෙනවා. කර්මයක් සිද්ධ කලායින් පස්සේ ඒ කර්මයට සම්බන්ධ වෙච්ච ඒ ප්‍රත්‍යය ගුණය නිසා ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැදෙනවා. ප්‍රත්‍යය උප්පන්න ධර්ම කියල කියන්නේ කර්මයේ බලයෙන් චේතනාවේ බලයෙන් හදල දෙන දේ. අවස්ථා තිබෙනවා - සිත් තිබෙනවා 36ක්. චෛතසික ධර්ම තියෙනවා ඒවත් එක්ක වැඩ කරන 38ක්. ඒවගේම කර්මජ රූප වර්ග 3 ක් තියෙනවා. ඒ තමයි ප්‍රතිසන්ධි අවස්ථාවේදී කර්මජ රූප කියල ටිකක් පහළ වෙනවනේ. ඔන්න නැවත වතාවක් තේරුම් ගන්ට හොඳ තැනක්. ඒ තමයි අපි මවු කුසක පිළිසිඳ ගන්න කොට ඒ මවුකුසේ ඉස්සරවෙලාම පිළිසිඳ ගන්නේ හිතක්. ඒ හිත - ඒ ප්‍රතිසන්ධි විඥ්ඥාණය හැදෙන වෙලාවේ (ඒ ප්‍රතිසන්ධි සිත් කියල කියන්නේ විපාක සිතක්) ඒ විපාකය හැදෙන්ට වෙන කොහේ හරි තැනක - මීට ඉස්සරවෙලා ජීවිතියේ - මීට ඉස්සරවෙලා ආත්මයක කොහේ හරි තැනක නිෂ්පාදනය කරපු - හදපු බලයක් ඔතෙන්ට සේන්දු මාන්දු වෙනවා. ඒක ගලාගෙන ආපු තැනක් එහෙම නැත්නම් පරණ එහෙකින් කඩා වැටිච්ච ශක්තියකින් තමයි ප්‍රතිසන්ධි සිත හැදෙන්නේ. ඒ ප්‍රතිසන්ධි සිත හැදෙන වෙලාවේදී ඒක එක්කම හැදෙනවා ප්‍රතිසන්ධි කර්මජ රූපයක් කියල එකක්. දැන් ඔය වැඩේ තියෙන්නේ - යම්කිසි තැනකදී රූපයක් ආධාරකරගෙන - ශරීරයක් ආධාර කරගෙන කර්මයක් හැදුවානම් ඒකෙ විපාකය එනකොට එන්නෙත් රූපයක් ආධාර කරගෙන තමයි විපාක සිත් හැදෙන්නේ. එතකොට යම්කිසි තැනකදී කර්මයක් කරන වෙලාවේදී මනෝමය රූපයක් හදාගෙන කර්මයක් කළානම් ඒ මනෝමය රූපයක් ඒකට ආධාර වෙච්ච මනෝමය රූපයක් එක්ක තමයි ප්‍රතිසන්ධි විපාකය

හැදෙන්නේ. යම්කිසි විදියකින් කර්මය කරන වෙලාවේ හිතට රූපයක් ආධාර කරගන්නේ නැතුව නාම ධර්මයක්ම ආධාර කරගෙන කර්මය රැස් කලානම් ඒකෙ විපාකය හදන වෙලාවේදී වෙන්නෙත් රූප නැති නාමම ආධාර කරගෙන විපාක හැදීමයි. ඕක තමයි ධර්මයේ තිබෙන විදිය. ඕක තමයි ස්වභාවධර්මයේ තිබෙන විදිය. දැන් මවු කුසක පිළිසිඳ ගන්න වෙලාවේදී මව්කුසේ ප්‍රතිසන්ධි විපාක සිත හැදෙන කොට ඒ මවු කුසක ප්‍රතිසන්ධියක් ගන්ට කරපු කර්මය කරලා තියෙන්නේ ඊට ඉස්සරවෙලා කොහේ හරි රූපයක් - ශරීරයක් - ඇඟක් ආධාර කරගෙනයි. ඒකනිසා ඒ රූපාධාරයක් එක්ක කරපු කර්මය රූප පට්ටල වීමක් - රූප එක්කාසු වීමක් - රූප වලට හිතවත් කමක් දැක්වීමක් තියෙනවා කර්මය කරන වෙලාවේ. රූප ආධාරයක් රූපත් එක්ක මිශ්‍ර වෙලානේ කර්මය කරේ. එතකොට ඒ විපාක සිත යම්කිසි තැනක ප්‍රතිසන්ධිය හදන වෙලාවට අර ප්‍රතිසන්ධි විපාක සිත් හැදෙනකොට ඒ ප්‍රතිසන්ධි විපාකයට සරිලන සිත ඉස්සරවෙලා හදපු වෙලාවේදී රූපයක් ආධාර කරගෙන තිබ්බ්ච නිසා එතනදී රූපයක් හැදෙනවා. ඒකට කියනවා 'ප්‍රතිසන්ධි කර්මජ රූපය' කියල. ඔන්න එකක්.

අනිත් එක තමයි සමහර වෙලාවට තිබෙනවා ඕකේ තව පැත්තක්. දැන් බලන්ට අසංඥ තලයේ සත්වයෙක් හැටියට පහළ වෙන රූපයේ හිත නෑ. හේතුව කර්මය එකතුකරන වෙලාවේ - කර්මය රැස් කරන වෙලාව තියෙනවනේ - භාවනා හරි මොකක් හරි කරලා කර්ම රැස් කරන වෙලාවේදී කරේම 'නාම එපා' 'නාම එපා' 'නාම එපා' කියල හිත ප්‍රතික්ෂේප කිරීමයි කලේ. හැබැයි ඒ වැඩේ කලේ නෑ රූපය සම්බන්ධයෙන්. රූප එපා - ඕනේ නෑ කියල ප්‍රතික්ෂේප කිරීමක් කලේ නෑ. අඩු පාඩු දැක්කේම - ඇඳ කුද දැක්කේම නාම ධර්ම වල - හිතේ - ඒක නිසා ඒකෙ විපාකය හදනකොට හැදෙන්නේම නිකංම නිකං මැටිගොඩ වගේ හැදෙන්නාවූ රූප කායක් විතරයි. ඒක ප්‍රතිසන්ධියක් හැටියට සලකනවා. ඔය එකක්.

දැන් එතකොට රූප හැදෙනවා - එකක් තමයි 'ප්‍රතිසන්ධි කර්මජ රූප' = 'සිතත් එක්ක කර්මජ රූප'. අනිත් එක තමයි 'අසංඥතලයේ කර්මජ රූප' = 'සංඥාව නැති හිත නැති'.

අනිත් එක තමයි මේ ලෝකයේ අපිට ප්‍රවෘත්ති කාලයේ හැදෙන කර්මජ රූප. දැන් අපි හැම එක්කෙනාටම මේ වෙලාවේදී ප්‍රවෘත්ති වශයෙන් රූප සමූහයක් පහළ වෙනවා. අපි දන්නේ නෑ අපි හිතාගෙන ඉන්නේ කන බොන නිසා ගන්න ආහාර පාන බෙහෙත් හේත් ව්‍යායාම නිසා මේක දුවනයි කියල. ඒවම නෙමෙයි. තව තියෙනවා මේකේ අභ්‍යන්තරයේ මහා ගොඩක් සංකීර්ණ set එකක්. ප්‍රවෘති කර්මජ රූප පහළ වෙනවනේ. ප්‍රවෘති කර්මජ රූප බලන්න - ඇහැ තුල ප්‍රසාද රූප - මේවා ඇති වෙනවා නැති වෙනවා - ප්‍රසාද රූප ඇතිවෙනවා නැතිවෙනවා. ඉතින් ප්‍රසාද රූප ටික 'චක්ඛු ප්‍රසාද රූප' නැති වෙන නැති වෙන එකට අලුතින් අලුතින් ටිකක් හදල දෙනවා. ඊයෙ හදල දීපු ටිකෙන් ඊයේ රූප ටිකක් දැක්ක. ඉතින් ඒ ප්‍රසාද රූප ටික ඊයේ අභාවයට ගියා. අදට නෑ. ඉතින් අද අපට බලන්න ප්‍රසාද රූප හැදෙන්ට එපායැ. ඉතින් ඒ පරණ එන line එකේම එකම විදියට හැඩතලේ තියෙන ප්‍රසාද රූප ටිකක් ආයේ හදල දෙනවා. අද හැදිච්ච ප්‍රසාද රූප ටිකෙන් අපි ඔය වට පිටාවේ තිබෙන රූප ටිකක් අද

බැලුවා. ඉතින් ඕක හෙට වෙනකොට නෑ. හෙට ආයිත් ටිකක් අපිට හදල දෙනවා රූප ටික බලන්ට.

ඊළඟට අද හදල දීපු සෝත ප්‍රසාද රූප ටිකෙන් අපි ශබ්ද ටිකක් ඔහේ වද්දගෙන ඇහුවා. දැන් මේ වෙලාවේ බණ අහනවා - ධර්මය අහනවා - සද්ද ටිකක් එනවනේ - ඉතින් මේ කියන සද්ද ටිකට මේක අහගන්ට ඊයේ පහළ වෙලා තිබ්බ්ච සෝත ප්‍රසාදයේ රූප ටිකෙන් බැනේ මේ ටික වද්ද ගන්න. ඒකනිසා දැන් දැන් අලුතෙන් සෝතප්‍රසාද පහළ වෙන්න ඕනෑ. ඕකට කියනවා ප්‍රවෘති කර්මජ රූප (පවතින කාලේ කර්මජ රූප) හදල දෙනවයි කියල. ඕක යම්කිසි විදියකින්වත් නැවතුනොත් එහෙම කොහෙන්ද බණ අහන්නේ? මේවා කැවට හැදෙන ඒවා නෙමෙයිනේ ඔය සෝත ප්‍රසාද චක්ඛු ප්‍රසාද එහෙම. ගඳ සුවඳත් එහෙමයි රස විදීමත් එහෙමයි ස්පර්ෂත් එහෙමයි. ඊළඟට හෘදය වස්තු රූපය - මේවත් ඇත්තටම මැරෙන්ට මැරෙන්ට පහළ වෙනවා. මෙන්න මේ පහළ වීමටත් අර පරණ පරණ ගෙවී ගිය කර්ම තියෙනවනේ - ඒ කියන්නේ හදල යටගිය ඒවා - ඒවා බලපානවා. දැන් මේ වෙලාවට පහළ වෙන්නාවූ අපේ මේ ශරීරයේ තිබෙන්නාවූ මේ ප්‍රවෘති රූප හැදෙන්න - මේ ප්‍රවෘති රූප වලට අර කර්ම බල පෑම තියෙනවා. දැන් මේවා ප්‍රත්‍යය උප්පන්න රූප.

අසංඥතලයේ සත්වයන්ගේ ප්‍රත්‍යය උප්පන්න රූප (ප්‍රත්‍යය භාවයෙන් හටගත්ත) රූප තියෙන්නේ. ප්‍රතිසන්ධි අවස්ථාවේදී අපිට ප්‍රත්‍යය උප්පන්න රූප හැදුන. ඒ line ඒකේ ඒ පේළියේම යන ප්‍රවෘති ටික තමයි දැනට තියෙන්නේ. ඊළඟට විපාක සිත් වලින් අපිට ප්‍රතිසන්ධි විපාකයක් ආව. ඒ අස්සේ චෛතසික තිබුන. දැන් මේ වෙලාවේ තිබෙනවා ප්‍රතිසන්ධි සිතට සමාන භවාංග සිතක්. ප්‍රතිසන්ධි සිතට සමාන භවාංග සිතක්. ඒ භවාංග සිතත් ඇවිල්ල මේ වෙලාවේ ප්‍රවෘතියක්නේ තියෙන්නේ - ඒක විපාක සිතක්. ඉතින් ඒ විපාක සිතට එනම් ඒ භවාංග සිතට ගැලපෙන විදියට දැන් ඔන්න හැදෙනවා අපේ ඇඟේ කර්මජ රූප. ආන්න ඒ විදියට බලන්ට ප්‍රත්‍යය උප්පන්න භාවයෙන් ප්‍රත්‍යය උපන්නව මේ රූප හැදෙන්ට කර්ම වශයෙන් අනිත් ඒවා බලපාපු විදිය අනිත් අර 33 ටම තිබෙන බල ආපු විදියට.

තව එකක් කියන්ට ඕන. අපි බලමු ආර්යන් වහන්සේලාගේ ඵල සිත් ක්‍රියාත්මක වෙන විදිය. නිර්වාණය හසුවෙන අවස්ථා 4 ක් තියෙනවා. ඒ තමයි මාර්ග සිත් වලින් නිර්වාණය ඉස්සරවෙලාම විනිවිද දැකබලා ගන්න තැන. මේ අවස්ථා 4 රේ නිවන තහවුරු වෙනවා - නිවන හොඳට අවබෝධ වෙනවා හැබැයි සකෘදාගාමී මාර්ග සිතට අවබෝධ වෙනවාට වඩා ටිකක් අඩු මට්ටමකින් තමයි නිවන සෝවාන් සිතට අහුවෙන්නේ. හැබැයි සෝවාන් මාර්ග සිතේදී නිර්වාණය සම්බන්ධයෙන් නිවන් දැකීමට හේතුවෙන බධාවෙන යම්කිසි ක්ලේශයක් තිබෙනවද ඒක නැතිකරගන්න පුළුවන් කම සෝවාන් මාර්ග සිතට තියෙනවා. හැබැයි සකෘදාගාමී මාර්ග සිතේදී ඊට වඩා වැඩි සතියක් හයියක් තියෙනවා. අනාගාමී හිතේ ඊටත් වඩා හයියක් තියෙනවා. ඒවගේම රහත් හිතේ ඊටත් වඩා වැඩි බලයක් තියෙනවා. දැන් ඵල සිත් විදිනව - ඒ කියන්නේ ඒ හතර දෙනා - සෝවාන් ආර්යන් වහන්සේ

සකෘදාගාමී ආර්යන් වහන්සේ අනාගාමී අරහත් යන ඒ ආර්යන් වහන්සේලා 4 දෙනෙක් පේළියට වාඩි වෙලා තමන් අවබෝධ කරගත්ත නිර්වාණ ධාතුව නිර්වාණ ධර්මය අත්විඳිනව. අත් විඳින්නේ ඵල සිත් වලින්. නිවන් අවබෝධ කරගන්න අවස්ථාවේ විතරයි මාර්ග සිත පහළ වෙන්නේ. ඒ කියන්නේ අපි ඔය කොච්චර පාරමී පිරුවත් කල්ප ගණන් නිවන් පතාගෙන සෝවාන්වෙන්ට සෝවාන්වෙන්ට කියල දානේ දීලා භාවනා කරලා සිල් රැකලා දෙමව්පිය උපස්ථාන වන්දනා මාන සාංඝික දාන ආදී මොන දේවල් කරලා නිවන් ප්‍රාර්ථනා කරත් කොච්චර ගස් යට වාඩිවෙලා මහන්සිවෙලා භාවනා කලත් අපිට හම්බවෙන්නේ එක ක්ෂණයක මාර්ග සිතක් විතරයි. එච්චරයි. දෙක තුනක් නෑ. එකම එක මාර්ග සිතක් විතරයි අපිට හම්බවෙන්නේ. ඉතින් එහෙම හම්බ වෙච්ච මාර්ග සිතකින් නිවන මුණ ගස්සා ගත්ත - මාර්ග සිතක් හරහා නිවන හමුකර ගත්ත - නිවන ස්පර්ශ කරාවූ - නිවන දැක්කාවූ ඒ ආර්යන් වහන්සේලා 4 දෙනා සෝවාන් සකෘදාගාමී අනාගාමී අරිහත් ආර්යන් වහන්සේලා - ඒ හතර දෙනා පේළියට ඉඳගෙන තමන් අවබෝධ කරගත්තාවූ නිර්වාණ ධාතුවේ ස්වභාවය - නිර්වාණ ධාතුවේ ලක්ෂණ - නිර්වාණ ධාතුවේ රසය - නිර්වාණ ධාතුවේ තිබෙන සෞම්‍ය බව - නිර්වාණ ධාතුවේ තිබෙන සුන්දරත්වය - නිර්වාණ ධාතුවේ තිබෙන සැහැල්ලු බව - නිර්වාණ ධාතුවේ තිබෙන සිහිල් බව - කෙලෙස් නැති බව - හිතන්ට දෙයක් නැති බව - කිසිම කරදරයක් නැති බව අත් විඳිනවා - හතර දෙනාම පේළියට ඉඳගෙන. නිවනේ නිමිති නෑ - නිවනේ වෙනස් වෙන ජාති නෑ - මේ හතර දෙනා මේ නිවන අත් විඳින්නේ ඵල සිත් වලින්. ඵල සිත් කියල කියන්නේ ජවන් සිත් ජාතියක්. ඒ ජවන් සිත් වලින් තමයි මේ නිර්වාණය අත් විඳින්නේ. නිර්වාණය හසු කර ගන්නේ. නිර්වාණය හොඳට යොමු කරගෙන ඒ ඵල සිත් වලින් තමයි අනිත්‍යතාවයක් නැති - බර බවක් නැති - රූප ලක්ෂණයක් නැති - පාට වර්ණයක් නැති - ඒවගේම නාම ධර්ම ක්‍රියාත්මක වෙන පැත්තක් නැති - ඒ නිර්වාණ ධාතුව අත් විඳින්නේ ඵල සිත් වලින්. ඵල සිත් දිගට පේළි පේළි - පේළි පේළි ගොඩ පහළ වෙනවා. ඒ ඵල සිත් පේළි වලින් නිර්වාණ ධාතුව විඳිනව. ඒ නිර්වාණ සැපය විඳිනව. මේ හතර දෙනා විඳින කොට විඳින්නේ ආකාර 4 කටයි. තමන්ට පෙනිච්ච හැටියට තමන්ට දැනිච්ච හැටියට තමන්ට හසුවෙච්ච හැටියට. උදාහරණයක් හැටියට කියනවනම් අපේ මට්ටමෙන් බොහෝම ප්‍රාථමික පුංචි උදාහරණයක් කිව්වොත් එහෙම අපි හතර දෙනෙකුට දෙනවා focusing capacity එක හතර ආකාරයකට තිබෙන්නාවූ binoculars (දුරක්‍ෂ) 4 ක් එක තැනක් බලන්න - කන්දක් දිහා බලන්න. එතකොට මේ දුරක්ෂ 4රෙන් එකම වස්තුවක් දකිනවා 4 දෙනා දකිනවා හැබැයි ඒ දුරක්ෂ 4 capturing capacity එක වෙනස්. එකක තියෙනවා 80% එකක තියෙනවා 60% තව එකක තියෙනවා 40% තව එකක තියෙනවා 20% දැන් බලන්ට 20% තියෙනවා පෙනීමේ ගතිය 40% ක පෙනීමේ ගතිය 60% පෙනීමේ ගතිය 80% පෙනීමේ ගතිය. දැන් මේ හතර දෙනා එකම වස්තුවක් බලන්නේ. හැබැයි 4 දෙනාටම එකම වස්තුව පේනවා. හැබැයි ඒ පෙනෙන කොට ඒ හතර දෙනාම දකින්නේ බලන්නේ levels හතරකින්. එතකොට මේ levels හතරට මේ විදියට පේන්න බලපෑමක් කරල දෙනවා මාර්ග සිත් වලින්. මාර්ග සිතේ තිබෙන්නාවූ ඒ හයිය නිසා තමයි ඒ මාර්ග සිතේ තිබෙන හයියට අනුකූලව තමයි ඵල සිතේ තිබෙන්නාවූ ක්‍රියාව. ඒක නිසා සෝවාන් වෙච්ච එක්කෙනාගේ මාර්ග සිතේ ප්‍රත්‍යය ගතියත් තියෙනවා ඒකෙ ඵල සිතට. 'ප්‍රත්‍යය

උප්පන්න ස්වභාවයක්' – 'හේතු ඵල නෙමෙයි'. මෙතන තිබෙන්නේ උපකාරක ස්වභාවය. මාර්ග සිතෙන් දැක්කේ 20% ක් ප්‍රමාණයෙන්ද එහෙමනම් ඵල සිත් වලින් දකින්න පුළුවන් කම තියෙන්නේ 20% ප්‍රමාණය පමණයි. ඊට වඩා වැඩි කරන්න බෑ. ඒ ජේන ලක්ෂණය එච්චරයි තියෙන්නේ. ඊට වඩා වැඩි වෙන්න නම් සකෘදාගාමී වෙන්න ඕන. සකෘදාගාමී මාර්ග සිතට අල්ලලා දෙනවා යම්කිසි ගැම්මකට යම්කිසි ප්‍රමාණයකට නිර්වාණය හසු කරලා දෙනවා. ඵල සිත් වලින් නිර්වාණය අත් විඳින්ට යනකොට ඒ මට්ටමට තමයි දකින්නේ. ඊට වඩා ඕනෙනම් අනාගාමී වෙන්න ඕනේ. අනාගාමී සිතට යම්කිසි ආකාරයකට ඒ නිර්වාණය අහුකරලා දෙනවාද ඵල සිත් වලින් විඳින්ට ලැබෙන්නෙත් එච්චරයි. ඊට වඩා වැඩියෙන් ඕනෙනම් රහත් වෙන්න ඕනේ. රහත් මාර්ග සිතට අහුකරලා දෙනවා හොඳම හොඳට ප්‍රභාෂ්වර වූ ඒවාගේම හොඳට ඉර පැච්චා වගේ ඒ නිර්වාණය තහවුරු කරල දෙනවා ඵල සිත් වලට දැනෙන්නෙත් ආන්න ඒ වගේම bright ගතියක්. මේ විදියට මේ ඵල සිත් වල ප්‍රත්‍යය ගුණය තියෙන්නේ මොකේද? අන්න අර කියන්නාවූ මාර්ග සිත් වල. ඒක නිසා මේ මාර්ග සිත් සහ සිත් 33 ක් තිබෙනවා කර්ම එහෙම නැත්නම් චේතනාවේ තිබෙන්නාවූ හැකියාව ගොඩගත්ත. ඒ අවස්ථා 33 හදල දෙන්නාවූ ශක්තිය වෙනස් වෙනස් ආකාරයෙන් නිකුත් වී යන ගතිය සලකන එකට කියනවා 'කර්ම ප්‍රත්‍යය' කියල.

ඉතින් ඕකේ තව දිගට තියෙනවා කියන්න. ප්‍රත්‍යයනීක කියල කොටසක් තියෙනවා. ඒක අපි සලකන්නේ නෑ. සමහර ආධුනික අයට ගොඩවල් තුනකට මේක හිතා ගන්ට ටිකක් පටලැවිල්ලක් වෙන නිසා. නමුත් ඒකෙ අර වීථි සලකා බැලීම තියෙනවා වෙනම. අපි ඒකත් පසු අවස්ථාවකදී සිද්ධ කරමු. ඉතින් මම මේ වෙලාවේදී මේ පින්වතුන්ට ආශිර්වාද කරනවා හැමදෙනාටම. බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥානය කියල අපි අහල තියෙනවනේ. සර්වඥතාඥානය - සියල්ල දකින්නා වූ නුවණ. මේ සර්වඥතාඥානයේ තිබෙන්නාවූ තීක්ෂණ සූක්ෂම විසිතුරු බව යම්තරම් අපේ පුංචි මට්ටමට හිතා ගන්න පුළුවන් කමක් තියෙනවානම් ඒකට උපකාරයක් වෙනවා ඒ සර්වඥතාඥානයේ තිබෙන විසිතුරු බව හිතා ගන්න - මෙහෙමයි කියල හිතා ගන්න හරි උපකාරයක් වෙනවා මෙන්න මේ ප්‍රත්‍යය ධර්ම පිළිබඳව අපේ හිත්වලින් විමර්ශනය කරලා හොයාගෙන බලාගෙන යනකොට.

බුදුරජාණන්වහන්සේත් තමන් වහන්සේගේ ඒ උතුම් නුවණින් තීක්ෂණ වූ ඒවාගේම සූක්ෂම වූ වේගවත් වූ විනිවිධ දකින්නාවූ ඒ ඥානය මේ කියන්නාවූ චෛතසික වල තිබෙන හැඩය දක්වනවා චේතනාවේ තිබෙන විශේෂ හැකියා බව සිත් වල තිබෙන හැකියාව - රූප වල තිබෙන හැකියාව සහ නොහැකියාව. ඔය ඔක්කෝම එක එක - එක එක - එක ගොඩේ තිබෙන්නාවූ ඒවා වෙන වෙනම හඳුනා ගත්තනේ. වෙන වෙනම දැන ගත්තනේ. ඒක මහා පුදුම පුදුම ඥානයක්. ඒක මහා විසිතුරු ඥානයක්. ඒ ඥානය ලබපු නිසා ඒ ඥානයන් දැකපු නිසා ඒ ඥානයෙන් සපර්ෂ කරපු නිසා තමයි ඒ ටික ඒ සපර්ෂ කරලා ඒ ඥානයෙන් අවබෝධ කරගෙන මේ විදියට යම් තරම් ප්‍රමාණයකට හෝ චේචා මේක අතුරලා විග්‍රහ කරලා දිග හැරලා කාණ්ඩ කරලා කොටස් කරලා පුංචියට කඩලා ඒ විදියට දක්වලා තිබෙන නිසා තමයි අපි මේ එක එක ගස් කොළං උපමා අරගෙන එක එක ජාති මේ පට්ටල කරගෙන මේ තේරුම් ගන්නේ. අපිට ඒ විදියට හිතන්න අපිට මේ අවස්ථාව සැලසුවේ බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥානයේ ආනුභාවබලයෙන්. ඒ සර්වඥතාඥානයට

ආශිර්වාදයක් හැටියට  සර්වඥතාඥානය බබුලුවන්ට සර්වඥතාඥානයට වන්දනාවක් හැටියට පහළ වූ සාරිපුත්‍ර මහරහතන් වහන්සේගේ ඒ උතුම් වූ විග්‍රහය නිසා ඒ ශ්‍රාවකයන් වහන්සේගේ උත්තරීතර කරුණාභාවය නිසා අපිට තව ඉතුරුවෙලා තිබෙනවා. ඒ නිසා අපි අද මේ කථා කරේ පැති දෙකක්. එකක් තමයි කර්මය හැදෙන තැන අනිත් එක තමයි ඒකෙ විපාකය ගලාගෙන යන තැන. දැන්මේ අවස්ථා දෙහෙක සිද්ධ වෙන නිසා මේකට කියනවා නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යය ස්වභාවය කියල. ඒ ඒ නා නා ක්ෂණික කර්ම ප්‍රත්‍යය ස්වභාවය අපිට දැන ගැනීමේ වාසියකුත් තියෙනවා. අපි කවදාකවත් ඔය මොනවා හරි දෙයක් අපිට සිද්ධ වෙනකොට අපිට ඔය ප්‍රශ්න ඇතිවෙන්නේ නරක විපාක එනකොටයි. නරක විපාකයක් එනකොට - ඉතින් ඒක පුළුවන් තරම් පොලීසියටත්  ගිහිල්ල වෙන කොහේට හරි කාටහරි පට්ටල කරන්ට උත්සාහ කරනවා. පුළුවන් අවස්ථාවලුත් තියෙනවා. ඒ කියන්නේ අපිම කරගත්තු දූර්වල මොකක්හරි කර්මයක් නම් ප්‍රයෝග සම්පත්තිය යොදල ඕකනේ අපි කරන්නේ. ප්‍රයෝග සම්පත්තිය යොදල අවවාදයක් කරලා හරි එහෙම නැත්නම් නඩුවක් දාල පොලිසියේ ගිහිල්ල එහෙන් මෙහෙන් කරගන්න පුළුවන් අවස්ථාවල් නැතිවාම නෙමෙයි. සමහර අවස්ථා තියෙනවා ඕවගේ ගිහිල්ල පටලැවුනයින් පස්සේ කොන පට බේරගන්න බැරි වෙනවා - මොකට මේවා පටලවා ගත්තදැයි කියල එහෙමත් හිතෙනවා. සමහර වෙලාවට වෙනවා කර්ම ඇවිල්ල අපි අපිම කරගත්ත දේවල්නේ - අපිම හදාගෙන කරේ බෑග් එකේ එකතුකරගෙන තියෙන කැලි ඕවා.

අපේ මේ කර්ම ප්‍රත්‍යය කියන එක අපි අවස්ථා 12 ක් වැඩියෙන් පාවිච්චි කරනවනේ. ඒ කියන්නේ අකුසල් සිත් 12 ට ඕන තරම් නටන්ට අපි ඉඩදීලා තියෙනවා. මම අහල තියෙනවා සමහර play grounds දෙන්නේ නැතුලු විශේෂිත permission එකක් නැත්නම්. Playground එක උනාට ලස්සනට තිබුනට දෙන්නේ නැතුලු හැම එක්කෙනාටම. මම අහල තියෙන කථාවක්. මේ පින්වතුන් ඊට වඩා හොඳට දන්නවා ඇති. ඒකට හරි නීති තියෙනවා හැම එක්කෙනාටම playground එක පාවිච්චි කරන්න බෑ. ඉතින් සමහර play grounds තියෙනවා සෙල්ලම් පිට්ටනි තියෙනවා ඒකෙ නැති මනුස්සයෙක් නෑ. සෙල්ලන් කරන මිනුස්සුත් ඉන්නවා පුහුණු කාරයොත් ඉන්නවා බල්ලොත් ඉන්නවා බළලුත් ඉන්නවා හොරුත් ඉන්නවා තක්කඩිත් ඉන්නවා හැම එක්කෙනාම ඉන්නවා. අපේ හිතත් ගත්තයින් පස්සේ මේ අකුසල් සිත් 12 ට ඕනෑ දෙයක් කරගන්ට පිට්ටනියක් වගේ අත ඇරලා තියෙන්නේ. ඉතින් ඒ නටන නටන හැම අවස්ථාවකදීම ඔය එක්කෙනෙකුට බැනපු කර්මයක් - ඊර්ෂ්‍යා කරපු එකක් - රවපු එකක් - හයිරම් part දාන්න කරපු කර්ම - ඊට පස්සේ කේලමක් දෙකක් කියාපු කර්ම - ඊට පස්සේ ඇද කුද දක්වපු කර්ම - ඊට පස්සේ බොරු කියපු ඒවා ඒවාගේම පොඩි පොඩි වස්තු වල හැටියට ගස් වලින් කඩාගෙන හොරෙන් කාපු ඒවා - ඔය ඕවා  ගොඩ මේකේ තියෙනවා. සමහරවෙලාවට හොරකම් කරන අයට උදව් කරපු ඒවා - බොරු කියන අයට උදව් වෙච්ච ඒවා - එව්වත් ඕකේ තියෙනවා.

ඔය අස්සේ මනුස්සයෙක් වැටුනට පස්සේ එයාට නැගිට්න්න උදව් කරපු කර්මත් තිබෙනවා. බල්ලෙකුට බළලෙකුට කෑම ටිකක් දීපුවා තිබෙනවා. දෙමව්පියන්ට උදව් උපකාර කරපුවා

තියෙනවා. ඔයවගේ හොඳ කර්මත් ඕකේ අස්සේ තියෙනවා. පොඩි ඒවා ලොකු ඒවා මිශ්‍රණයක්නේ තියෙන්නේ. දැන් ඕවත් තැන් තැන්වල තැන්තැන්වල අවස්ථාව බල බලා ඉඳල දෙන්න පුළුවන් අවස්ථාවකදී දෙන්න පුළුවන් ඒ rate එකේ කර්මයක් ඇවිල්ල අපිට විපාක දෙනවා. ඉතින් අපි තේරුම් ගන්න ඕන මේවා අපිම හදපු කර්ම තමයි අපිට එන්නේ කියල. අපිම හදපු කර්ම අපිට එනවා. ඉතින් මෙතනින් issue වෙන්න එපාය. හදල තිබුනෙත් මේ චිත්ත පරම්පරාවේ ඉහළ තැනකනේ. ඉතින් ඒවාගේ තේරුම් ගන්න කොට අපිට අර කම්පන ඒවගේම වෙනත් කෙනෙකුට අපි මේ චෝදනා කරන්න යන ඒවා නවතිනවා. එතකොට ලෝකයට යම්කිසි සහනයක් සැලසෙනවා. ඉවසීම කියල කියන එකත් ඔන්න ඔය වගේ. ඉතින් සමහර ඒවා තියෙනවා අපිට ප්‍රඥාව සලසල දෙනවා සමහර ඒවා තියනවා අපිව අමාරුවේ දානවා. ඒ නිසා මේකත් තේරුම් අරගන්න අපිට හොඳ උදව්වක් වෙනවා මේ කර්ම ප්‍රත්‍යය සලකා බැලීම.

අද නා නා ක්ෂණයක කර්ම ප්‍රත්‍යයේ තිබෙන්නාවූ විශේෂත්වය තමයි අපි මතක් කලේ. ඒ නිසා මේ ධර්මය අවබෝධ කරගත්ත ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ අපරිමාණ වූ ගුණානුභාවබලයෙන් සර්වඥතාඥානානුභාව බලයෙන් කර්මයේ විපාකය දකින්නාවූ නුවණේ ආනුභාව බලයෙන් ප්‍රත්‍යය ධර්මයන් දැනගත්තාවූ ඒ උතුම් නුවණේ ආනුභාවබලයෙන් ඒවාගේම සාරිපුත්‍ර මහරහතන් වහන්සේගේ අනන්ත අපරිමාණ සීල සමාධි ප්‍රඥා ගුණයන්ගේ ආනුභාව බලයෙන් මේ පින්වතුන් මේ ධර්මය ඇසීමෙන් හිතීමෙන් මෙනෙහි කිරීමෙන් උපදවා ගත්තාවූ සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් සැමදෙනාටම තව තව ධර්මය අහල මෙනෙහි කරලා හිතල හොඳට තව ගැඹුරින් මේ කරුණු වටහාගෙන තේරුම් අරගෙන විසඳ වූ ඥානයක් සකස් කරගන්න මෙය හේතු උපනිශ්‍රය වේවා! ඒවාගේම සැම දෙනාටම ධර්මය වැටහේවා අවබෝධ වේවා! කර්මයෙහි තිබෙන භයානකත්වයත් විපාකයේ තිබෙන්නාවූ භයානකත්වයත් කර්ම ප්‍රත්‍යයෙහි තිබෙන්නාවූ නියම ස්වරූපයත් ප්‍රත්‍යය උප්පන්න ධර්මයන්ගේ තිබෙන්නාවූ නියම ස්වරූපයත් තේරුම් අරගෙන කර්මයක් සිද්ධ වෙන්නේ නැති කර්ම විපාක සිද්ධ කරන්නේ නැති මේ කර්ම විපාක කියන්නාවූ ඒ ධර්මතා දෙකින්ම අයින් වූ කර්මයක් නැති විපාකයක් නැති හේතුවක් නැති හිතක් නැති චෛතසික රූප මොකක්වත්ම නැති හේතු ඵල ධර්මයට කිසිම සම්බන්ධතාවයක් නැති පිරිසිදුවූ ශාන්ත වූ නිර්මල වූ අසංඛත ධාතුව නම් වූ ඒ උතුම් නිර්වාණ ධාතුව සැමදෙනාටම උතුම් ආර්ය නුවණින් අවබෝධ කරගන්ට ලැබේවා! සියලු දෙනාගේ සිත් නිර්වාණ ධාතුවෙන් නිවනින් නිවේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. හැම දෙනාටම තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි! අවසරයි ගෞරවණීය ස්වාමීන්වහන්ස ධර්ම දේශනාව දිගටම අහගෙන යනකොට මට හිතුනේ ස්වාමීන් වහන්ස චේතනාව සහ කර්මය කියන එක හුගක් බලවත් කියල. එතකොට ස්වාමීන්වහන්ස මට මෙහෙම අදහසක් ආව. දැන් මේ කර්ම ශක්තියම කර්ම ප්‍රත්‍යයම එහෙම නැත්නම් චේතනාවම ඍතු නියාම බීජ නියාම චිත්ත නියාම ධම්ම නියාම කම්ම නියාම කියල නියාම ධර්ම තියෙනවා. එතකොට ඒවායෙනුත් එතන

බලවත් කමක් තියෙනවද? ඊළඟට දැන් අපි ගත්තොතින් සෘතුජ ආහාරජ වගේ දේවල් ප්‍රත්‍යය වෙන්නත් මේ කර්මයේ බලපෑම් එනව වගේ කියල අදහසක් ආව ස්වාමීන්වහන්ස ඒක ගැලපෙන ප්‍රශ්නයක්ද දන්නේ නෑ. ඔබ වහන්සේට පුළුවන් නම් ඒක ගැන සඳහන් කරොත් බොහොම පිං.

<u>පිළිතුර</u> - නියාම ධර්ම 5 න් එකකට විතරක් ගැලපිලා යනවා කර්ම නියාමය කියන එක. කර්ම නියාමය කියන එක මේකට සම්බන්ධ කරන්න පුළුවන්. අනිත් ඒවාගේ පොඩි සම්බන්ධයක් තියෙන ඒවත් තිබෙනවා නැති ඒවත් තියෙනවා. ඒක හැබැයි මම මීට ඉස්සරවෙලා අවස්ථාවකදීත් කිව්ව එකක් තියෙනවා. සමහර වෙලාවට කර්මය සම්බන්ධ වෙලා පොඩි පොඩි බාහිර දේවල් එන අවස්ථා තියෙනවා. හැබැයි ඒවගේ දේවල් සෘතුවෙන්ම වෙනවා කියන දේවල් නෙමෙයි. දැන් අපි හිතමු දේවානම්පියතිස්ස රජතුමා පහළ වෙන කාලේ එතුමාට ඒ රාජ්‍යවෙන කාලේ මුතු වර්ග 8 ක් මිනිස්සුන්ට හම්බ උනාලු. එතකොට ඒවා රජ තුමාගේ පිනකට පහළ උනා කියල කියන්නේ. දැන් මුතුයි පිනයි බලන්නකෝ වෙනස් නේ. දැන් මුතු කියන ජාති මුහුදේ තියෙන ඒවා. ඒ මුතු කියන ජාතිය මුහුදේ තියෙන ඒවා ඒ සත්තුන්ගේ බෙල්ලන්ගේ හරි මුහුදේ ස්වභාවිකව හරි තිබෙන දේවල්නේ. ඒවා එහෙ තියෙන්නේ නැතුව පුද්ගලයාට ළං කරලා දුන්නනේ. ඒකෙ තියෙනවා යම්කිසි කර්ම බලවේගයක්. අනිත් එක තමයි ඔය රත්තරන් ආකර පහළ වෙනවා. ඒ රත්තරන් කියන ඒවා පොළොවට සම්බන්ධ ඒවා. නමුත් ඒවාගේ තියෙනවා ඒ අයිති කාරයට ඒ කර්මය තියෙන එක්කෙනාට පොඩ්ඩක් කිට්ටු කරලා දෙන ගතිය.

දැන් චක්‍ර රත්නය කියල එකක් තියෙනවා කියනවනේ. එකතැනක තියෙනවලු චක්‍ර රත්නය කියල එකක්. ඒ චක්‍ර රත්නය දැන් කවුරුහරි excavate කරන්න ගිහිල්ල ඕව කොහෙද තියෙන්නේ කියල හාරල හොයන්න බෑනේ. නමුත් පින තියෙන ඒ පුණ්‍යවන්තයා ආවයින් පස්සේ ඒක පහළ වෙලා මතුවෙලා එනවා කියනවනේ තියන තැනින් නැගිටලා. අන්න එහෙම අවස්ථා තියෙනවා. Directly කර්මයට සම්බන්ධ ඒවත් තියෙනවා නැති ඒවත් තියෙනවා. ටිකක් චක්‍රාකාරව දුරින් දුරින් සම්බන්ධවෙන ඒවත් තියෙනවා. තෙරුවන්සරණයි!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඒකටම සම්බන්ධ ද කියල දැනගන්න කැමතියි අර ... .. මන්ධිර වගේ ඒවා කම්ම සමුට්ඨාන සෘතුජ රූප වගේ දේවල් හැදෙන තැනත් ඒවගේ සම්බන්ධයක් තියෙනවද ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඔව් මහත්තය එහෙම තියෙනවා. ඒ කියන්නේ සෘතුජ දේවල් පහළ වෙනවා කර්මයේ තල්ලුවක් එක්ක. කර්මයේ විදියට තමයි ඒක සිද්ධ වෙන්නේ. දැන් ඔය දෙවි දේවතාවන් පහළ වෙනකොට කවදාක්වත්ම ඒ ගොල්ලො ගිහිල්ල ගෙවල් හදන මාලිගා හදන විමාන හදන කට්ටියක් නෙමෙයිනේ. පහළ වෙන එකකනේ ඒ ඉන්නේ. එතකොට ඔය ඒ පහළ වෙන දේවල් ඒ අයගේ තිබෙන කර්මයේ බලපෑමක් තල්ලුවක් කර්ම ආනුභාවයක් නිසා බාහිරව පහළ වෙන්නාවූ වස්තු. ඒවාට කියනවා කර්මයෙන් හටගත්තාවූ

ඍතුජ රූප කියල. 'කම්ම සමුට්ඨාන ඍතුජ රූප' . හැබැයි මෙතන කියන්නේ ඇත්තවශයෙන්ම අර චක්‍රාකාරව කෙළවරවල් දෙහෙකට ගිය ඒවා නෙමෙයි. මෙතන කර්ම විපාක රූප කියන ඒවා කෙලින්ම ආපු ඒවා - 'කර්මජ රූප'. අර විදියට සම්බන්ධ වෙන ඒවත් තියෙනවා. දෙවි දේවතාවන්ගේ සමහර වෙලාවට ඇඳුම් පැලඳුම් ඊළඟට තව තියෙනවනේ කල්ප වෘක්ෂ එහෙමත් මිනුස්සුන්ගේ පිනටනේ පහළ වෙන්නේ.

ස්වාමීන්වහන්ස අවසරයි මේ ප්‍රවෘති කර්මජ රූප ගත්තහම දැන් අපිට මෙතෙන්දි රූප ප්‍රවෘතිය ගත්තහම ජීවිත ඉන්ද්‍රිය රූපයෙන් විශේෂ මෙහෙයක් සිද්ධ වෙනවා කියල අපි ඉගෙනගෙන තියනවා ස්වාමීන්වහන්ස. එතකොට ස්වාමීන්වහන්ස කර්මජ රූප නොබිඳ පවත්වා ගැනීමත් ඒ කියන්නේ සන්තතියක් වශයෙන් ප්‍රවෘති කාලයේදී පවත්වා ගැනීමට ජීවිත ඉන්ද්‍රිය රූපය විශේෂයෙන්ම උපකාර වෙනවා කියල ස්වාමීන්වහන්ස. එතකොට මේ ජීවිත ඉන්ද්‍රිය රූපය කර්මජ රූපයක් හැටියට ලැබෙන්නත් ප්‍රතිසන්ධි සිතේම තියෙන කර්ම ශක්තිය බලපානවා කියල තේරුම් ගත්තොත් නිවැරදි ද ස්වාමීන්වහන්ස? එතකොට එකම කරන ලද කර්මයක් නිසා ඇතිවෙන ප්‍රතිසන්ධි සිතේ තියෙන කර්ම ශක්තිය තමයි ඒ ජීවිතේන්ද්‍රිය ඇතුළු අනිත් කර්මජ රූප වලට බලපාන්නේ කියල කොහොමද ස්වාමීන්වහන්ස අපි ඒක විස්තර කරගන්නේ?

<u>පිළිතුර</u> - සම්බන්ධතාවයක් තියෙනවා. Flow එක - එක level එකේ යන්නේ. දැන් ප්‍රතිසන්ධි සිතට සමානයි භවාංග සිත් එහෙම. ඊළඟට ඒ හදල දෙන්නාවූ කර්මජ රූප පවත්වාගෙන යෑමට තිබෙන්නාවූ ඒ ජීවිතේන්ද්‍රියත් ඒ රංචුවක නැත්නම් ඒ රූප කලාපයක පැවැත්ම විතරනේ ඕකේ බලපාන්නේ. ඒ රූප කලාපයක පැවැත්ම ඉවරවෙලා ඒ ටික නැතිවෙන කොට ඊළඟට ජීවිතේන්ද්‍රිය අනිත් ඒ එන ඒවා පරම්පරාවට යන්න එක level එහෙකට තමයි ඒ විපාක සිත් ඒවගේ වැඩ කරන්නේ. රූප කලාපයක් පහළ උනායින් පස්සේ ඒ චිත්තක්ෂණ ප්‍රමාණයක් තියෙනවා. ඒ චිත්තක්ෂණ ප්‍රමාණය පවත්වාගෙන යන්න විතරයි ඒ ජීවිතේන්ද්‍රිය එතනදී උපකාර භාවයක් ඇතිවෙන්නේ. එතනින් එහාට ඒක පවත්වන්න ගන්න ස්වභායෙන්ම ජීවිතේන්ද්‍රියත් නැතිවෙලා යනවා. ඒවාගේම අනිත් ටිකත් නැතිවෙලා යනවා. නමුත් ඒක පරමපරා වශයෙන් ගෙනියන්න සමාන ස්වභාවයක් තිබෙනවා. හැබැයි මෙහෙම එකක් තියෙනවා. ඔය ප්‍රතිසන්ධි අවස්ථාවේදී ඇතිවෙන්නාවූ කර්මය එතනදී හරිම බලවත්. ඒ හිතේ තිබෙන්නාවූ එකත් ඒවගේ. ආරම්භක අවස්ථාවක්නේ. ඊට පස්සේ යන ඒවා එක්තරා level එහෙකට තමයි යන්නේ. ඒකෙ අඩුවක් කියල කියන්නේ නෑ. ගානකට තමයි යන්නේ. ඒක නිසා සමාන තත්වයක් තිබෙනවා.

ස්වාමීන්වහන්ස ඒ කියන්නේ කර්මජ රූප ප්‍රවෘතියට හේතු වෙන්නේ අර ප්‍රතිසන්ධි සිතට අදාලව ඊට පෙර කරන ලද කර්මයද? එකම කර්මය නිසාද ඒ විදියට යන්නේ කියන එක පොඩ්ඩක් පැහැදිලි කරල දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - එහෙම වෙනවා. දැන් කෙනෙකුට හිතන්න පුළුවන් එක ක්ෂණයක් කරපු කර්මය කොහොමද මෙච්චර කාලයක් අල්ලා හිටින්නේ කියල. එහෙම තියෙනවා. කර්මයේ

තිබෙනවා දැන් එක ගොයම් ගහකින් එක වී ඇටයකින් වී කරල් මහා බර ගානක් හදල දෙනවා. ඒවගේ එක කර්මයකින් ප්‍රතිසන්ධි ප්‍රවෘති සිත් හදල දෙනවා ගොඩක්. ඒ එකක්. තව කරපු කර්ම තියෙනවනේ ඒවගෙන් ඒක අල්ලලා දෙනවා. උපස්තම්බනය කරල දෙනවා. දැන් ඔය කර්ම විස්තර කරන තව ක්‍රමයක් තියෙනවා - සමහර වෙලාවට තියෙනවා - කර්මය එක ලයින් එකේම ගියාට පස්සේ 'මේකෙන් ඉවරයි' නේද කියල එහෙම හිතෙනවා. නෑ කර්මයේ තියෙනවා උත්පාදන ලබා දෙන කර්ම තියෙනවා - උත්පාදනය ලබා දුන්නට පස්සේ දෙවනුව ඒවා පවත්වාගෙන යන්ට උදව් උපකාර කරන්නා වූ කර්ම තියෙනවා. ඒ කර්ම වල line එකෙත් තිබෙනවා එකම වර්ගයේ කර්ම හදල දෙන ඒවා. ඒ විදියටයි මහත්තයා.

හොඳයි ස්වාමීන්වහන්ස බොහොම පිං. තවත් පොඩි ප්‍රශ්නයක් අහන්නම් ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අද අපිට විස්තර කරලා දුන්නා දැන් අපි මවු කුසක ඉපදෙනවනම් එතැන රූපයක් ප්‍රතිසන්ධි වශයෙන් ඇතිවෙන නිසා එතකොට ඒ විදියේ සිතක් ඇතිවෙන්න නම් රූපයක් ඇසුරු කරගෙන සිතක් පහළ වෙන්න ඕන වගේ. එතැන තේරුම් ගන්න තියෙන්නේ ස්වාමීන්වහන්ස අපි හිතමු අරූපී බ්‍රහ්මලෝකයක ජීවත් වෙන බ්‍රහ්මයෙක් චුත වෙන කොට රූපී බ්‍රහ්මලෝකයක ප්‍රතිසන්ධි ගන්න අවස්ථාව වගේ ගත්තොත් ඒ කියන්නේ එතැන චුති වෙන අවස්ථාවේදී රූප සම්බන්ධයෙන් යම්කිසි උපාදානයක් එහෙම නැත්නම් සිතුවිල්ලක් ඇතිවෙලා නිසාද ඒක වෙන්නේ කියන එක පැහැදිලි කරලා දෙන්න පුලුවන්ද ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - අරූපී බ්‍රහ්මලෝකයේ පහළ වෙලා ඉන්නාවූ බ්‍රහ්මයෙක් කිසිම අවස්ථාවකදී රූප ලෝකයට උප්පත්ති වශයෙන් එන්න හේතුවෙන කර්මයක් එහේදී සකස් කරන්නෙත් නෑ සකස් කරන්න අවස්ථාව නෑ. එතකොට විශේෂ පින්කම් ආදී පවත්වන දේවල් නෑ. එතකොට ඒක රූප භූමියක් නොවෙයි. ඒක ඇවිල්ල මනස අරූපී ධර්මයක එකට ගැට ගැහී රැඳී පවතින්නාවූ අවස්ථාවක්. එයාගේ කාල සීමාව ඉවරවෙලා එතනින් චුත වෙන්ට යන අවස්ථාවේදීත් රූපා වචර බ්‍රහ්මලෝකයකට උප්පත්ති වශයෙන් එනවා නම් අරූපී බ්‍රහ්මරාජයාට මතක් වෙන්නේ - එතැනදී එයාට පහළ වෙනවා පෙර ජීවිතවල ආසන්න ජීවිතයක - ඒකියන්නේ අරූපාවචර බ්‍රහ්මලෝකයේ ප්‍රතිසන්ධිය ගන්න කලියෙන් ඇතිවෙච්ච මතකයක්. ඒ මතකයකට අනුව ඒ හැදිච්ච පරණ රූපයක එල්ලීගෙන ඒකට අනුකූලව තමයි එයාගේ ප්‍රතිසන්ධිය හැදෙන්නේ. කෙලෙස් නැති කරපු කෙනෙක් නෙමෙයි නිසා පරණ අනුශය වශයෙන් තිබෙන ගොඩක් පරණ දේවල් store එකේ දාල තියෙනවා. දාල දාල දාල චුත වෙන අවස්ථාවේදී වෙන්නේ එයාට පරණ එකක් ඇවිල්ල ඒක අල්ලාගෙන ඒක උපාදානය වෙලා තමයි ඊළඟට යන්නේ. බ්‍රහ්මයාට උනත් චුති සිත කියන එක අමුතු එකක්. දැන් අපිට උනත් එහෙමයි. අපිට සමහර වෙලාවට අපි මේ හිතාගෙන හිටියට මේ මනුස්ස ලෝකේ ඉපදිලා මනුස්ස ලෝකේ ඉඳගෙන කරන්නාවූ දේවල් මතකයට එයි කියල හිතුවට එහෙම නෙමෙයි - සමහරවෙලාවට පරණකරපු දේවල් මිය යන අවස්ථාව වෙන කොට අපි කොච්චර දාන සීල භාවනා අරව මේවා කරලා තිබුනත් මීට පෙර ජීවිතයක හොඳට කරපු එහෙක බර පතල කර්මයක් නිකං එක පාරම මහා දවාලේ වගේ අපේ ඉස්සරහ හිතට එන්න පුළුවන්. අපි මේ ජීවිතයේ මොන දේවල් කරත් අපි ඊළඟ ජීවිතයේ ප්‍රතිසන්ධිය ගන්ට හේතුවෙන්නේ මීට ඉස්සෙල්ල ජීවිතයක කරපු එකක් තමයි ටක් ගාල ඇදල එන්නේ.

එහෙම තියෙනවා. ඒකනිසා අර අරූපාවචර බ්‍රහ්මලෝකයේ සිද්ධිය ඔය වගේ. එහෙදි කෙරෙන්නේ නෑ - රූප ආධාරයක් කරගෙන නැති නිසා කර්ම එතනදී හදන්නේ නෑ. නමුත් පරණ එහෙකින් තමයි එයා ගැටගැහිලා එන්නේ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි සවාමීන්වහන්ස බොහොම පින්!

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන්වහන්ස යම්කිසි කර්මයක් කරපු කෙනෙකුගේ අපි හිතමු වැඩ කරන්නේම අකුසල් සිත් 12 හම විතරයි කියල. එතකොට තවත් කෙනෙකුට පේනවා මේ කරන වැඩ වලින් මෙයා අකුසල්ම කරගන්නවා කියල. ඒ අවස්ථාවේ අපිට උදව්කරන්න පුළුවන් වෙයිද?

<u>පිළිතුර</u> - යම්කිසි කෙනෙකුට උදව්වක් කරන්ට ඕනෙනම් ඒකට ඇත්ත වශයෙන්ම තමන් කිව්වයින් පස්සේ අහන ඒවා තියෙනවා . එහෙම උනොත් එහෙම උපකාරයක් වෙන්න පුළුවන්. නැත්නම් එහෙම එයාට advertisement එකක් දාන්න ඕන. ඒකියන්නේ ඔය මිනුස්සු ඉන්නවා හොඳට advertisement එකක් දාල වෙන කෙනෙක් දම්මලා කිව්වයින් පස්සේ එයා කියන එක අහනවා. එතකොට එහෙම උදව්වක් උපකාරයක් වෙන්න පුළුවන්. ඒක සමාජයේ තියෙන එකක්. අපි සමහරුන්ට කියනදෙවල් නිතර නිතර - අපි හිතමු ගෙදර ස්වාමියා දරුවෝ භාර්යාව නෑදෑයෝ සහෝදරයෝ - ඔයගොල්ලන්ට යමක් කියන කොට නිතරම පේනවා - දකිනවා - ඇහෙනවා ඒ අයට කිව්වයින් පස්සේ ගණන් ගන්නේ නෑ. හිත බාරගන්නේ නෑ. එවැනි අවස්ථාවකදී එයාගේ හිත ගරු කරන වචනය අහක දාන්න බැරි කෙනෙක් ලව්වා ඒක කියන්න කියනවා. බුදුරජාණන්වහන්සේත් ඕක දේශනා කරානේ. එහෙම කිව්වයින් පස්සේ එයා පිළිගන්නවා. එහෙම උදව්වක් උපකාරයක් කරන්න පුළුවන්. සමහර වෙලාවට ඒගොල්ලන්ගේ ජීවිත වල තිබෙන්නාවූ පෞද්ගලික අත්දැකීම් එක්ක ජීවිත කණපිට ගහනවා. ලෙඩක් හැදුනම cancer එකක් හැදුනයින් පස්සේ එහෙම නැත්නම් වෙනත් මහා බරපතල දෙයක් ඇති උනාට පස්සේ වෙනත් කෙනෙක් සම්බන්ධ නැතුව. ආන්න එතකොට ටක් ගාල වැටෙනවා. දැන් අපි හිතමු මොකක් හරි රණ්ඩුවක් වෙලා අවි ආයුධයකින් පහර දුන්නයි කියල. එතකොට හැමවෙලේම එයා වෛරයක් හදා ගන්නවා. වෛරයක් හදා ගන්නවා ඒක වෙනත් අයෙකුගෙන් සිද්ධ වෙච්ච දෙයක් හැටියට එයා කාට හරි තල්ලු කරන්න මහන්සි ගන්නවා. හැබැයි සාමාන්‍යයෙන් ලෙඩක් හැදෙනවා කියන එක එහෙම නෙමෙයි. ඒකට කවුරුවත් සම්බන්ධ වෙලා නෑ. තමන්ගේ ජීවිතයෙන්ම එයාට තේරුමක් යනවා එතකොටත් ඒ ගොල්ලෝ ඔය නරක වැඩ වලින් අයින් වෙලා හොඳ වැඩ වලට එනවා. බොහෝ අවස්ථාවලදී හොඳම දේ තමයි එයාව පිළිගන්නාවූ එයා හිතෙන් ටිකක් ගරු කරන කෙනෙකුට කියල මාර්ගය පොඩ්ඩක් හසු කරලා දීම.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අවසරයි ස්වාමීන්වහන්ස ගිය සතියේ කියල දුන්න සහජාත කම්ම ප්‍රත්‍යය කියන එක ස්වාමීන්වහන්ස ඒක චිත්තක්ෂණික එකක් කියල තේරුම් ගත්තොත් හරිද?

<u>පිළිතුර</u> - සහජාත කම්ම ප්‍රත්‍යය කියල කියන්නේ ඒක චිත්තක්ෂණයක එකක්.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස එතකොට ස්වාමීන්වහන්ස ෂට්ඨායත්නය කියන එකයි සලායතන කියන එකෙයි වෙනස කොහොමද තේරුම් ගන්නේ ?

පිළිතුර - ෂට්ඨායතනය කියල කියන්නේ මනායතනයටයි. ෂට්ඨායතනය කියල කියන එක සමහරුන්ට ඕක තේරෙන්නේ නෑ. ඒක චිත්තක්ෂණයක පටිච්චසමුප්පාදය දක්වන තැන තමයි ෂට්ඨායතනය කියල බහුලව පාවිච්චි කරන්නේ. ෂට්ඨායතනය කියන්නේ මනායතනය කියන එකයි. 6 වෙනි ආයතනය කියන එකනේ. දැන් චක්ඛු සෝත ඝාන ජිව්හා රස කාය කියල අවසානයට කියනවා ෂට්ඨායතනය කියල. ඒ කියන්නේ මනායතනය ‘හිත’ කියන එකයි.

ස්වාමීන්වහන්ස දැන් චක්ඛු විඤ්ඤාණය කියන එක විපාක සිතක්නේ ස්වාමීන්වහන්ස එතකොට චක්ඛු විඤ්ඤාණය කියන එක සළායතනය කියල ගත්තොත් සූත්‍ර වල සඳහන් වෙන විදියට පටිච්චසමුප්පාදය එතකොට කර්මයක විපාක ක්‍රියාවලියක් විතරක්ද කියලද තේරුම් ගන්න ඕන ස්වාමීන්වහන්ස. මොකද අභිධර්මයේ සඳහන් වෙන විදියට හැමවෙලාවේම අවිද්‍යාව නැතුව පටිච්චසමුප්පාදය සඳහන් වෙන්නේ නැනේ ..........

පිළිතුර - සරලව කියනවානම් පටිච්චසමුප්පාදය කියන එක බොහෝ අය ඉගෙනගෙන තියෙන්නෙත් හදාරලා තියෙන්නෙත් දැනගෙන තියෙන්නෙත් කියන්නෙත් ඔය අවිද්‍යාව එක්ක තියෙන එක විතරයි. ඒ අවිද්‍යාව එක්ක තියෙන links 12 ම තියෙන කොටස පරිපූර්ණ පටිච්චසමුප්පාද විග්‍රහයයි. පටිච්චසමුප්පාදය තේරුම් ගැනීමේදී හැමතැනම හැම හිතකම පටිච්චසමුප්පාද තියෙනවා. කුසල් සිතෙත් පටිච්චසමුප්පාදය තියෙනවා අකුසල් සිතෙත් පටිච්චසමුප්පාදය තියෙනවා. ක්‍රියා සිතෙත් තියෙනවා විපාක සිතෙත් තියෙනවා. ඒක නිසා ඒ කවදාකවත්ම විපාක සිත කියන එක පටිච්චසමුප්පාදයෙන් මිදිච්ච එකක් නෙමෙයි. හැමතැනම පටිච්චසමුප්පාද ධර්ම ටික තියෙනවා. එතනදී හොයන්න යන්න හොඳ නෑ අර ඔක්කොම ටික - 12හම - දැන් බලන කොට ඕකේ ගන්නේ 9 යි. ඔය ඒක චිත්තක්ෂණයක පටිච්චසමුප්පාදයට ගන්න කොට ගන්නේ ප්‍රධාන වශයෙන් 9 ක් ගන්නේ. අනිත් ටික ඔක්කොම ඒක අස්සේ තියෙනවා. ඒක ක්‍රමානුකූලව ඉගෙන ගන්න ඕන. නැත්නම් එහෙම කෙනෙකුට මනසට පටලැවෙනවා. දැන් විපාක සිතක පටිච්චසමුප්පාදය බලන කොට බලන්නේ - ඔතන ධර්මතා තිබෙනවා - ෂට්ඨායතන වැඩේ කරනවා විඤ්ඤාණය - එතකොට අනිත් ධර්ම වැඩේ කරනවා තිබෙන්නාවූ චෛතසික ධර්ම ටික - අනිත් එක තමයි චක්ඛු විඤ්ඤාණය පහළ වෙනකොට නිකං හුදකලාව පහළ වෙන්නේ නෑ. යම්කිසි තැනක් ආධාර කරගෙන තමයි පහළ වෙන්නේ. ඒ තමයි චක්ඛු ප්‍රසාදය. චක්ඛු ප්‍රසාදය ආධාර කරගෙන පහළ වෙනකොට ඔන්න රූප සම්බන්ධය එතන ගොඩ නැගෙනවා. ඊළඟට අරමුණු කිරීම් වශයෙනුත් රූප සම්බන්ධය ගොඩ නැගෙනවා. ආන්න ඒ විදියට ඵස්සය කියන එක එතන ගොඩ නැගෙනවා. ඊළඟට ෂට්ඨායතනය කියන එක - එතන තියෙනවා විඤ්ඤාණය කියන එක. වේදනාව කියන එක එතන මතු වෙනවා. ඒක විපාකයක් නිසා විපාක සිතට ගැලපෙන විදියට තමයි ඒක බලන්නේ. හැබැයි ඒවා සිද්ධ වෙන්නේ ඉස්සරවෙලා තැනකදී කරපු එකක් හින්ද තමයි. නමුත් මේ අවස්ථාවේදී පටිච්චසමුප්පාද ධර්ම සමුදාය බලන කොට ඔය විඤ්ඤාණ සිතේ අවිද්‍යාව සංඛාර අරව මේවා ඔක්කොම එකට දාල බලන්නේ නෑ. ඒකෙ

තියෙන සීමාවේ තිබෙන පටිච්ච අංග ටික විතරයි බලන්නේ. ඒක තමයි නියම විදියට පටිච්ච අංග බැලීම. දැන් අර සූත්‍ර දේශනා වලත් පටිච්ච සන්ධිස්ථාන තිබෙනවා ගණනාවක්. ඒ තැනට තියෙන ටික විතරයි බලන්නේ. ඒක නිසා එක එක හිතක් හිතක් පාසා බලන කොට පටිච්ච අංග ඒ හිතට යෙදිලා තියෙන ප්‍රමාණය තමයි බලන්නේ - තැනින් තැනට වෙනස් වෙනවා.

බොහොම පින් ස්වාමීන්වහන්ස

හොඳයි එහෙනම් අද දවසේදීත් අපිට මේ ධර්ම සාකච්ඡාව  නිමා කරන්න වෙලාව එළඹ තියෙනවා. අද දවසේදීත් අපිට භාග්‍යක් ලැබුණා නවසීලන්තයේ වෙලින්ටන් නුවර වැඩ වාසය කරන බන්තේ ජිනාලංකාරයන්ගෙන් ඉතාමත්ම අගනා ධර්ම දේශනාවටත් ඉන් අනතුරුව ධර්ම සාකච්ඡාවකටත් සවන් දෙන්න. මම එහෙනම් අද දවසේ රැස්ව සිටින සියලුම කල්‍යාණ මිතුරු මිතුරියන් වෙනුවෙනුත් අනාගතයේදී මේ ධර්මය ශ්‍රවණය කරන්නාවූ කල්‍යාණ මිතුරු මිතුරියන් හැමදෙනාම වෙනුවෙනුත් ගෞරවණීය ස්වාමීන්වහසේ ඔබ වහන්සේ මේ කලාවූ උතුම් වූ ධර්ම දානමය පුණ්‍ය ක්‍රියාව හේතුවෙනුත් අප විසින් කලාවූ කිසියම් කුසලයක් ඇත්ද  ඒ සියලුම කුසල් හේතුවෙන්ද ඔබ වහන්සේට පූර්ණ වශයෙන්ම චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමට මේ ධර්ම දානමය පුණ්‍ය ක්‍රියාවද හේතුවක් වේවා කියල ප්‍රාර්ථනා කරමින් ඔබ වහන්සේට යොමුවෙනවා ස්වාමීන්වහන්ස අද සාකච්ඡාව නිමා කිරීම සඳහා.

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි පින්වතුනි තෙරුවන් සරණයි සැමදෙනාටම යහපතක් වේවා! ඉතින් අදත් අපි සියලුදෙනාම එක්කාසු වෙලා බුදුරජාණන්වහන්සේ ගාම්භීරව දේශනා කොට විස්තර කොට තිබෙන්නාවූ ධර්ම ගොඩක එක් කොටසක් විතරක් අපි හැම එක්කෙනාටම පුළුවන් ප්‍රමාණයෙන් පුළුවන් මට්ටමෙන් අරගෙන මේ හිතුවේ මෙනෙහි කළේ කථා කළේ දේශනා  කළේ. ඒවා අහන අහන වචනයක් පාසාම ධර්මය හොයා යන ධම්මවිචය බොජ්ඣංග ගුණය - ප්‍රඥාව පහළ උනා. ඒවා හිතල මෙනෙහි කරන අවස්ථාවේදී ලෝභයට අවස්ථාවක් නෑ අපේ හිතට ගොඩවෙන්න ද්වේශයට මෝහයට අවස්ථාවක් නෑ. ඒක නිසා කුසල් සිත් පරමපරාවක් ඇතිඋනේ. ඉතින් මේ කුසල් සිත්වල මහා විශාල බලයක් තිබෙනවා නිවන් දකින තෙක්ම. ඒ නිසා මේ උපදවා ගත්තාවූ බණ ඇසීමේ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් පින්වත් දළුවත්ත මහතාටත් නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ඒවගේම මහත්මයාගේ සියලුම අපල උපද්‍රව අතීත අකුසල කර්ම බලවේග යටපත්වෙලා කුසල කර්ම බලවේග ශක්තිය මතු කරගෙන යහපත්ලෙස නිරෝගී භාවය පවත්වාගෙන මේ සාසනයේ මනුස්ස ජීවිතියෙන් වැඩ ගන්ට අවස්ථාව සැලසේවා! ඒවාගේම පවුලේ සැමදෙනාටම සැනසිල්ලක් වේවා! ඒවාගේම ඒ පින්වත් මහත්මයාල මහත්මීන් සැම දෙනාටම මේ උතුම් ධර්මයේ ආනුභාව බලයෙන් බණ ඇසූ පිනේ ආනුභාව බලයෙන් තුනුරුවන් සතු ගුණ බලයෙන් මේවගේ උතුම් ධර්ම මනසිකාරය පවත්වාගෙන ගැඹුරු ධර්මය හිතාගෙන මෙනෙහි කරගෙන අහගෙන සාකච්ඡා කරමින් ගැඹුරු තැන් ප්‍රශ්න කරමින් විසඳව වටහාගෙන සැමදෙනාටම පාරමී පුරාගෙන උතුම් අමා මහා නිවනින් සැනසෙන්ට

ලැබේවා! නිවන් පිණිස මේ  ධර්මය ඇසීමේ පින් සැමදෙනාටම හේතු  වාසනා වේවා කියලා මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා ආශිර්වාද කරනවා සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.